Journal of Intangible Cultural Heritage

JICH (2025), Volume 3 (II)

# A Socio-anthropological Study the Ritualistic Background Associated with the Seenigama Dewalaya

## සීනිගම දේවාලයේ යාතුකර්ම පිළිබඳ සමාජ - මානව විද්‍යාත්මක විශ්ලේෂණයක්

R. M. R. S. Rajapaksha

Department of Sociology, Faculty of Arts, University of Colombo, Sri Lanka.
*ruwinirajapaksha7@gmail.com*

### *Abstract*

*Lay people usually associate religious sites with the aspiration of making their mundane and super mundane desires a reality. This research was focused towards the ritualistic functionality of the Seenigama Dewalaya both in terms of white and black rituals. The research was a socio-anthropological research and a qualitative one. The sample of the research comprised of two in-charges of the shrines of sea shrine (Muhundu Dewalaya) and costal shrine (Verala Dewalaya) of Seenigama Dewalaya and 10 devotees who came in search of divine assistance. The sample was purposively selected. Semi-structured interviews, in-depth interviews, and observation techniques were utilized as the data collection tools. Thematic analysis was employed as the data analyzing technique. Research findings are as follows; Devotees engage in making vows and white magic in the coastal shrine whereas curses and black magic are done in the sea shrine. The devotees coming to Seenigama Dewalaya are in three main forms; fishermen, politicians and people from governing bodies and lay public. Fishermen make vows to Seenigama dewalaya to protect themselves from unexpected hazards on the sea and to increase their self – esteem required for multi-day sea tours. Lay people make visits to Seenigama dewalaya with the intention of punishing the people who did them wrong. Political leaders go there with the hope of winning elections and defeating their political rivals. The research concludes that Seenigama Dewalaya predominantly tries to feed the needs of the mundane society and it manifests a cross-section of the Sri Lankan psycho-social realm.*

***Key Words:*** *Mundane aspiration, Religious practices, Rituals, Seenigama Dewalaya*

## 1. හැඳින්වීම

සමාජ ව්‍යුහය පවුල, අධ්‍යාපනය, ආගම, ආර්ථික සහ දේශපාලන යන සංස්ථා පහකින් නිර්මිත වූවකි. මෙකී සමාජ සංස්ථා අතුරින් ආගමික සංස්ථාවට ඉතා සුවිශේෂී ස්ථානයක් හිමිවේ. මිනිස් සංහතියේ ආරම්භයේ සිටම මිනිසා ආගම හා බැඳී සිටී. මැක්ස් මුලර් ප්‍රකාශ කරන ආකාරයට, මිනිසාගේ ඉතිහාසය යනු ආගමේ ඉතිහාසය වේ (කුමාර, 2002: 15).

සංස්කෘතිකමය වශයෙන් අන්තර් ක්‍රියාවක් පවතින අධි භෞතික පුද්ගලයකු හෝ මනුෂ්‍යයකු පිළිබඳ වූ විශ්වාසය ආගමයි. එමෙන් ම ලෝකය විවිධ සංස්කෘතික ලක්ෂණවලින් හෙබි සමාජ කොට්ඨාසයන් ගෙන් පිරී තිබෙන අතර එහි විවිධත්වය ඇතිවීමට ප්‍රධාන වශයෙන් හේතු වන්නේ ඒ ඒ රටවලට ආවේණික ස්වභාවධර්මයේ බලපෑම් යැයි කිව හැකිය. විශේෂයෙන් ම රටක පවත්නා භූගෝලීය හා දේශගුණික වෙනස්කම් අනුව එම රට ගොඩනැගෙන බව නූතන විද්වත්හු පිළිගෙන සිටිති. එක ම රටක් තුළ වුව ද ප්‍රාදේශික වශයෙන් වෙනස් වන මෙකී භූගෝලීය හා දේශගුණික විපර්යාසයන් ද හේතු කොටගෙන විවිධ සංස්කෘතික ස්වරූපයක් බිහිවීම ද දැක ගත හැකි ය.

ඇතැම් සංස්කෘතීන් ට අදාළව විවිධ සංස්කෘතික හා ආගමික ලක්ෂණ ගොඩනැගී ඇත. චාරිත්‍ර වාරිත්‍ර, ජීවනෝපාය, ක්‍රියාකාරකම්, රුචි අරුචිකම්, අභිප්‍රායයන් සිතුම් පැතුම් සහ භාෂාව ආදී බොහෝ දේ මේ හා සමගාමීව වෙනස් වේ. මේ අනුව බැලීමේදී ඒ ඒ ආගම්වලට ආවේණික වූ යාතුකර්ම ද වෙනස් වේ. තවද මේ එක් එක් ආගමට අදාළ පුද පූජා, සිරිත් විරිත් සහ ඇදහිලි යාතුකර්ම වෙනස් ය. ඒ අනුව බලන කල ආගම්වල විවිධ වූ වත් පිළිවෙත් පවති. එමෙන් ම දේවාල ආශ්‍රිත ව දෙවියන් උදෙසා සිදුකරනු ලබන යාතුකර්ම පිළිබඳව ද අධ්‍යයනයට භාජනය කළ හැකි ය.

ධර්‍මහිටැනැරු (1962) ප්‍රකාශ කරන ආකාරයට, ලෝකෝත්තර කාරණා සඳහාත්, ලෞකික කාරණා සඳහාත් වෙන් වූ ආගමික සිද්ධස්ථාන පවතී. ආගමික සිද්ධස්ථානයක් වශයෙන් ආගමික වත්පිළිවෙත්වලට පමණක් සීමා නොවී සමාජමය වශයෙන් අවශ්‍යතා හඳුනාගනිමින් කටයුතු කිරීම මෙහි විශේෂත්වයකි. මේ අනුව මෙම පර්යේෂණය ඔස්සේ ශ්‍රී ලංකාවේ බහු සංස්කෘතික වන්දනාමය වැදගත්කමක් පවතින ආන්දෝලනාත්මක මෙන් ම සුදු අභිචාර, කළු අභිචාරවලින් සමන්විත සීනිගම දේවාලය පිළිබඳ සමාජ විද්‍යාත්මක විශ්ලේෂණයක් සිදුකොට ඇත.

## 2. පර්යේෂණ ක්‍රමවේදය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, හික්කඩුව වේරගොඩ, සීනිගම ප්‍රදේශයේ පිහිටා තිබෙන සීනිගම ශ්‍රී දෙවොල් මහා දේවාලය පර්යේෂණ ක්ෂේත්‍රය වශයෙන් තෝරාගන්නා ලදී. මෙම දේවාල පරිශ්‍රය ගත් කළ වෙරළ තුළ පවතින දේවාලය සහ වෙරළට ඔබ්බෙන් මුහුදේ කුඩා දූපතක පවතින දේවාලය ආදි වශයෙන් කොටස් ද්විත්වයකින් සමන්විත වේ. මෙම සිද්ධස්ථානයට බැතිමතුන්ගෙන් ලැබෙන අති සුවිශේෂී වැදගත්කම මෙන් ම කාලානුරූපීව මෙහි සිදුවී ඇති වෙනස්කම් ද සැලකිල්ලට ගනිමින් මෙම සිද්ධස්ථානය අධ්‍යයනය සඳහා තෝරා ගැනුණි.

පර්යේෂණ නියැදිය පිළිබඳ අයධානය යොමු කිරීමේ දී මූලිකව ම ප්‍රාථමික දත්ත ලබාගත් නියැදිය පහත දත්ත දායකයින්ගෙන් සමන්විත වේ.

- සීනිගම දේවාලයේ කපුරාලවරුන් අතුරින් අරමුණු සහගතව තෝරාගත් කපුරාලවරු දෙදෙනෙක්, (මුහුදු දේවාලයෙන් එක් කපුරාල කෙනෙක් ද වෙරළේ දේවාලයෙන් එක් කපුරාලවරයෙක් ද බැගින්)

- සීනිගම දේවාලයට පැමිණෙන බැතිමතුන්ගේ අරමුණු සහ සමාජ තත්ත්වය අධ්‍යයනය සඳහා එක් දිනෙකදී එම ස්ථානයට පැමිණෙන විශාල බැතිමතුන් සංඛ්‍යාව සළකා ඔවුන් නියෝජනය වන පරිදි අහඹු ලෙස තෝරාගත් 10 දෙනෙක්,

ලෙස තෝරාගන්නා ලදී. බැතිමතුන් තෝරාගැනීමේදී ස්ත්‍රී-පුරුෂ දෙපිරිස ම නියෝජනය වන පරිදි තෝරාගැනීමට උත්සුක විය. ආගමික සිද්ධස්ථානයට මූලික නියමු සමීක්ෂණයක් සඳහා යෑම තුළින් හඳුනාගත් කාරණාවක් වූයේ මෙහි පැමිණෙන බැතිමතුන් ගත් විට කාන්තාවන් සහ පුරුෂන් යන දෙපක්ෂය ම දේවාලය කරා පැමිණෙන බවයි. ඒ පිළිබඳව සැළකිලිමත් වෙමින් 10 දෙනෙක් ලෙස තෝරාගන්නා දත්ත දායකයින් කාන්තාවන් 05 දෙනෙක් ලෙසත්, පිරිමින් 05 දෙනෙක් ලෙසත් තෝරාගැනීම සිදු විය.

අරමුණු සහගතව තෝරාගත් කපුරාළවරු දෙදෙනා සමඟ අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා ද්විත්වයක් පැවැත්වීම තුළින් ගුණාත්මක දත්ත එක් රැස් කරගැනුණි. ඊට හේතු වූයේ ඔවුන් හරහා ආගමික සිද්ධස්ථානයට අදාළ විධිමත් දත්ත ලබාගැනීමට හැකි වීමයි. අහඹු ලෙස තෝරාගත් 10 දෙනෙකු වන නියැදියෙන් දත්ත එක් රැස් කිරීම සඳහා අවිධිමත් සම්මුඛ සාකච්ඡා විධික්‍රමය භාවිතා කරන ලදී. ඔවුන්ගේ ආගමික වත්පිළිවෙත්වලට බාධා නොවන ආකාරයෙන් දත්ත ලබාගත යුතු බැවින් මෙම සම්මුඛ සාකච්ඡා ක්‍රමය භාවිතා කරන ලදී.

එසේ ම සම්මුඛ සාකච්ඡා විධික්‍රමවලට අමතරව, සරල නිරීක්ෂණය ද විධික්‍රමයක් වශයෙන් යොදා ගැනුණි. එනම්, බැතිමතුන්ගේ ස්වභාවය, චර්යාව ආදිය නිර්ණයේදීත්, පූජා විධි සම්බන්ධ කටයුතු අවබෝධ කරගැනීමේදීත් නිරීක්ෂණය ඵලදායීව යොදා ගන්නා ලදී. එසේ ම, මේ සම්බන්ධයෙන් පවතින ද්විතියික සාහිත්‍යමය මූලාශ්‍ර ඔස්සේ ද දත්ත එක් රැස් කර ගැනුණි.

එක් රැස් කළ ගුණාත්මක දත්ත තේමා විශ්ලේෂණ ක්‍රමය ඔස්සේ විශ්ලේෂණයට ලක් කරන ලදී. එසේ ම, දත්ත විශ්ලේෂණයේදී කිසිදු ප්‍රතිචාරිකයෙකුගේ නම් නාම ආචාරධර්මීය කාරණා මත සඳහන් කර නොමැත. එසේ ම, කපුරාලවරු දෙදෙනාගෙන් ලබාගත් දත්ත ඉදිරිපත් කිරීමේදී ᵏ1ල ᵏ2 ලෙස ඔවුන්ව නම් කර තිබේ.

මෙම අධ්‍යයනය සිදු කරන විට විවිධ පර්යේෂණ සීමාවන්ට යටත්වීමට සිදුවිය. එහිදී කාලය ප්‍රධාන සීමාවක් බවට පත්විය. එමෙන්ම රටේ උද්ගතවී ඇති කෑඩසා 19 වසංගතය හේතුවෙන් සිද්ධස්ථානය වෙත ලගා වීම මෙන් ම සිද්ධස්ථානය තුළ සිටින්නාවූ පිරිස වෙත ළඟා වී තොරතුරු ලබා ගැනීම යම්තාක් දුරට ගැටලු සහගත කර්තව්‍යයක් විය. එමෙන් ම ක්ෂේත්‍රයට පිවිස තොරතුරු ලබාගැනීමේදී සිද්ධස්ථානයේ සිටි බැතිමතුන් ඉතා කාර්යබහුල වූ හෙයින් තොරතුරු ලබා ගැනීමේදී යම් යම් අපහසුතාවයන් වද ලක් වීමට සිදු විණි. තව ද මුහුදු දේවාලයට ගොස් පැමිණෙන බොහෝ බැතිමතුන් දත්ත ලබා දීමට අකමැත්තක් පළ කිරීම ද සීමාවක් ලෙස පෙන්වා දිය යුතු ය. ආගමික සිද්ධස්ථානයට වතාවත් සඳහා පැමිණෙන බැතිමතුන් මෙවන් පර්යේෂණයක් සඳහා සම්බන්ධ කරගැනීමේ දී ඔවුන්ගේ කාල වේලාව සහ ආගමික කාර්යයන්ට බාධා නොවන අයුරින් පර්යේෂණයේ කටයුතු සිදු කිරීම තරමක් සීමාකාරී විය. නමුත්, ආගමික සිද්ධස්ථානයේ කාර්ය මණ්ඩලයෙන් ලැබුණු සහයත්, ප්‍රතිචාරිකයින් සමඟ මනා සම්බන්ධතාවයක් ගොඩනගාගැනීමෙන් එම සීමාව මඟහරවා ගැනීමට හැකිවිය.

ප්‍රතිචාරකයන්ගෙන් දත්ත ලබා ගැනීමට පෙර ඔවුන්ව සිදුකිරීමට අපේක්ෂා කළ පර්යේෂණය පිළිබඳ දැනුවත් කරන ලදී. නියැදිය තොරතුරු ලබා ගැනීමේ දී ඔවුන් අපහසුතාවයට, කම්පනයට සහ චර්යා ගැටලු ඇති නොවන ලෙස දත්ත ලබා ගැනීමට යොමු විය. තව ද තෝරාගත් නියැදි පිරිස අතර සුහදත්වය විශ්වාසය ගොඩනගා ගැනීමට කටයුතු කරන ලදී. එමෙන් ම ප්‍රතිචාරයන්ගෙන් ලබාගත් දත්තවල විශ්වසනීයත්වය සහ

රහස්‍යභාවය ආරක්ෂා කිරීමට ද කටයුතු කරන ලදී. එහිදී ඔවුන්ගේ සත්‍ය නම් ගම් සඳහන් කිරීමෙන් වැළකී සිටීම ප්‍රධාන වශයෙන් ගත් ක්‍රියාමාර්ගයකි.

**සීනිගම ශ්‍රී දෙවොල් මහා දේවාලයේ පරිපාලන ව්‍යුහය**

ඕනෑම ආගමික මධ්‍යස්ථානයක පැවැත්ම සහ සංවර්ධනය සඳහා එහි පරිපාලන ව්‍යුහය ඉතා වැදගත් වේ. ඒ අනුව ගත් කල සීනිගම ශ්‍රී දෙවොල් මහා දේවාලය ආශ්චර්ය ජනක පුණ්‍ය ක්ෂේත්‍රයක් වුව ද වරින්වර එහි භාරකාරත්වය හා පරිපාලනය පිළිබඳ අර්බුද හා ගැටලු මතු වී ඇත. 1968 වසරේදී දේවාලයේ ගමන්මග ස්ථාවර අවධියකට පත්වූයේ අධිකරණයේ නඩු තීන්දුවක් අනුව ය. දේවාලයේ යථා විධ පරිපාලනය ස්ථාපිත කරමින් භාරකාර වරයෙකු පත් වනුයේ අධිකරණයේ නඩු තීන්දුවක් ඔස්සේ ය. 1968 දී දේවාල භාරකාරිත්වය මණ්ඩලයකට පැවරිණි.

අනේකවිධ මතගැටුම් භාරකාරත්ව අරගල ආදිය සමනය වී 1968 දී සීනිගම ශ්‍රී දෙවොල් මහා දේවාලයේ ප්‍රථම භාරකාර මණ්ඩලය හිමිවූයේ සීනිගම ශ්‍රී කුසුමාරාම මහා විහාරවාසී ශාස්ත්‍රවේදී තිත්තගල්ලේ සුදස්සී හිමි පාණන් වහන්සේගේ මූලිකත්වයෙන් යුතු මණ්ඩලයකට ය. දක්ෂිණ ලංකා තරුණ ලේඛක සංගමයේ සභාපති ඒ. පී. ඥානදාස මහතා එම සංගමයේ ලේකම් ලෙසත් මහින්දපාල ලංකා දේව මහතාසම ලේකම් ලෙසත් කටයුතු කොට ඇත. පසුව සීනිගම දෙවොල් මහා විහාරයේ ප්‍රමුඛයකු වූ ඒ.එච්. තිරිතේනිස් ද සිල්වා ප්‍රමුඛ නිළධාලධාරී මණ්ඩලයක මෙහෙයවීමෙන් විධිමත් හා සංවිධානාත්මක ලෙස කටයුතු ඇරඹුණේ ය.

එමෙන් ම ප්‍රථම දේවාල භාරකරු බවට පත් ඩී. ප්‍රියචන්ද්‍ර සිරිපාල මහතා 2008 වසර තෙක් භාරකාර මණ්ඩලයේ ක්‍රියාකාරිකයෝ අතර ඔහු ප්‍රථම භාරකරු ලෙස සැලකිය හැකිය. එවකට සීනිගම ශ්‍රී දෙවොල් මහා දේවාලයේ එතෙක් අඩුවක්ව පැවති බෝධීන් වහන්සේ නමක් රෝපණය කෙරිණි. එය අනුරාධපුර මහමෙව්නා උයනේ රෝපිත ජය ශ්‍රී මහා බෝ සමිඳුන් වෙතින් ලබාගත් තෙල්වත්ත පුරාණ තොටගමු රන්පත් රජමහා විහාරයේ රෝපිත බෝධීන් වහන්සේගෙන් ලබා ගත් ශාඛාවකි. එමෙන් ම පංචමහා දේවාලයක මහා දේවාලයක් ද දියඹ දේවාලයේ ප්‍රධාන දෙව්මැදුරේ විහාරාංග අතරට එක් කරන ලදී.

2008 සිට 2012 දක්වා භාරකාර ධුරයට පත් ඩී. එච් සම්පත් විරාජ් මහතා සිය පාලන සමයේදී දම්සභා මණ්ඩපයක් ද හා දියඹ දේවාලයේ දෙව් පියසක් ද නිර්මාණය කරවීය. 2013 මාර්තු 10 වනදා සිට සීනිගම ශ්‍රී දෙවොල් මහා දේවාලයේ භාරකාර පදවියට පත් වූයේ සරත් දිසෙන්තුවාහන්දි මහතා ය. ඔහු විසින් දෙවොල් මහා දේවාලයේ භෞතික අභිවෘද්ධිය උදෙසා අති විශාල මෙහෙයක් කරන ලදී. ඒ අතර දියඹ දේවාලයේ ප්‍රතිසංස්කරණ කටයුතුවලට අවතීර්ණ වූ අතර බැතිමතුන්ගේ ගිමන් නිවා ගැනීම සඳහා ගිමන් හලක් ද ඉදිකර වීය. නානුමුර දේවාභිෂේක මණ්ඩපය ද ඔහු විසින් ස්ථාපිත කරන ලදී. එමෙන් ම එවකට අඩුවක්ව පැවති නාන කාමර හා වැසිකිළි පද්ධතියක් ද ඔහුගේ මූලිකත්වයෙන් ඉදිකළේ ය.

තව ද බුදු මැදුර සකලාංග පූර්ණ දෙමහල් ගොඩනැගිල්ලක්, ජල පහසුව සඳහා වන වාරි පද්ධතියක්, ඇසල මංගල්‍යයේදී ඇතා පිට පිට සධාතුක කරඬුව තැන්පත් කරන කුර ගෙයක් ද ඉදිකෙරිණි. එමෙන් ම එවකට නොපැවති පිත්තල කොඩි පිත්තල කඩු පිත්තල අංකුශය පිත්තල මුතුකුඩ බිත්තර සේසත් මෙන් ම පිත්තල ශිල්ප කලා භාවිතයෙන් දෙවොල් දෙව් පියසේ ද්වාරය ද නිර්මාණය කරන ලදී.

## 03. ප්‍රතිඵල සහ සාකච්ඡාව

### 3.1 ආගමික සිද්ධස්ථානයේ ඉතිහාසය සහ පුද පූජා පවත්වන දෙවියන්

සීනිගම දේවාලය ඓතිහාසික පැරණිකම අතින් මෙයට වසර 1300 ගණනක අතීතයක් පිළිබඳව කියැවේ. එමෙන් ම පූජනීයත්වය දප්පුල රජ දවස බුද්ධ වර්ෂ (1207-1216) ක්‍රි.ව. 664-673 සිට පැවත එන්නක් බව පුරාවිද්‍යාත්මක කරුණු අනුව ද සනාථ වී ඇත. දෙවොල් දෙවි ඉතිහාසය මහා වංශයේ සඳහන් වන්නේ දේවාලය දපුළුසෙන් රජ දවස කර වූ බවට ය. එබැවින් සීනිගම ශ්‍රී දෙවොල් මහා දේවාලය දෙවුන්දරටත් කතරගමටත් වඩා පැරණි බව පිළිගැනේ. දකුණු ලක පැරණිත ම දේවාලය ලෙස මෙය සඳහන් වී ඇත. වීරගොඩ දෙවියෝ, දෙවොල් දෙවියෝ සහ සීනිගම දෙවියෝ යන නම්වලින් මෙම දෙවියන් ආමන්ත්‍රණය කරනු ලබයි (පලිහපිටිය, 2007).

එමෙන් ම බහු ආගමිකයන්ගේ වන්දනාවට පාත්‍රවන සීනිගම දේවාලය පිහිටා ඇත්තේ දෙවොල් දෙවියන් මුහුදෙන් පැමිණ ගොඩ ගොඩබැස්සා වූ ස්ථානය බවට විශ්වාස කෙරේ. ශ්‍රී දෙවොල් දෙවියන් වැඩම කළ ඒ දේව පුරාණ කතාවට අනුව ලංකාවට පැමිණි වෙනත් බොහෝ දෙවිවරුන් මෙන් ම දෙවොල් දෙවියන් ද දකුණු ඉන්දියාවේ සිටි දෙවි කෙනෙක් බව විශ්වාසයේ පවතී. දේව පුරාණ කතාව ඇරඹෙන්නේ දකුණු ඉන්දියාවේ රාමසිංහ රජ්ජුරුවන්ගේ කුමාරවරුන් සත් දෙනා ශ්‍රී ලංකාවට පැමිණීම පාදක කොට ගෙන ය. ඔවුන් දෙවොල් සත් කට්ටුව ලෙස ද හැඳින්වේ.

ඒ අනුව දෙවොල් දෙවියන් හා සම්බන්ධ පුරාවෘත්ත කිහිපයක් තිබෙන අතර ඒ අතරින් ප්‍රධාන ජනප්‍රවාදයට අනුව අතීතයේ දඹදිව කුදුප්පර නම් දේශයේ ජීවත් වූ රාමසිංහ නම් රජෙකුට සත්සියයක් බිසෝවරු වූහ. ඉන් ප්‍රධාන බිසවුන් සත් දෙනෙකු වූ අතර මෙම බිසෝවරුන් සත් දෙනා එකවිට ගැබ් ගත්හ. එක ම සතියක සත් දිනකදී එම බිසෝවරු පිළිවෙලින් දරුවන් ප්‍රසූත කළහ. දෙවොල් කුමාර සත්කට්ටුවේ විත්තිය නම් කවි පන්තියට අනුව ඔවුන්ගේ නම් මෙසේ විය.

ඉරු දින ඉරු රැස් සාමි උපන්නේ
සඳු දින සඳ රැස් සාමි උපන්නේ
කුජ දින තෙදරැස් සාමි උපන්නේ
බුද දින බුදුරැස් සාමි උපන්නේ

ගුරු දින ගිනි රැස් සාමි උපන්නේ
කිවි දිනයේ මහ සාමි උපන්නේ
කුඩා සාමි සනි දිනයෙ උපන්නේ
කුමරුන් සත් දෙන මෙලෙස උපන්නේ (ධර්මදාස සහ තුන්දෙනිය, 1994).

ඒ සත් දෙනාගෙන් බලවත් ම පුත්‍රයා *මහා සාමි* නම් වූ අතර මේ දරු පිරිස වැඩි වියට පත් වෙද්දී දුනු ශිල්පයෙහි දක්ෂයන් වූ අතර ඉවක් බවක් නොමැතිව ඔවුහු සතුන් දඩයමේ ගියහ. රටවැසියන් මේ ගැන රජුට දැනුම් දුන් විට ඒ ගැන ද කිපුණු මේ කුමාරවරු රටවැසියන් ද මරණයට පත් කළහ. මේ නිසා කලබලයට පත් රජු තමන්ගේ පුතුන්ගෙන් රාජ්‍යය බේරා ගැනීම සඳහා ඔවුන් නැවක පටවා පිටුවහල් කළේ ය.

මෙම පිරිස නැග ආ නෞකාව මුහුද මැද දී අනතුරට ලක් වන අතර වාසනාවකට මෙන් කුමාරවරුන් දිවි බේරා ගනී. ඔවුන් මුහුද මැද අතරමං වූ අතර එම සිද්ධිය මුහුදු මණිමේඛලාව (තවත් දෙවි කෙනෙකු) දැක සක්‍ර දෙවියන්ට කීමෙන් අනතුරුව සක්‍ර දෙවියන් ඒ පිරිසට ගොඩබැසීම සඳහා නිවැරදි මග පෙන්විය. ඒ අනුව මොවුන් පැමිණෙන්නේ ලංකාවට ය. ලංකාවේ වෙරළ තීරයෙන් මෙරටට ගොඩ බැසීම ඔවුන් සිතූ තරම් පහසු කටයුත්තක් නොවිණි. යාපනයේ දී නාථ දෙවියන් ද, හම්බන්තොට දී

කතරගම දෙවියන් ද, දෙවුන්දර දී විෂ්ණු දෙවියන් ද, කොග්ගල දී හිරිගල් බණ්ඩාර දෙවියන් ද, ගිංතොට සහ උඩුගල්පිටියේ දී මහා බ්‍රහ්මයාද, සීනිගම දී පත්තිනි දේවතාවිය ද මේ පිරිසට බාධා සිදු කළ බව සඳහන්ය. සීනිගම දී පත්තිනි දේවතාවිය ගිනි කඳු හතක් මවා ඔවුන් බිය වැද්දවීමට සැරසුණත් ඔවුන් කෙසේ හෝ එම ගිනි නිවා සීනිගමට ගොඩ බට බව පැවසෙයි.

සීනිගම ප්‍රදේශයේ එවකට පාලනය කළ පත්තිනි දෙවියන් ඔවුන්ට ගොඩ බැසීමට අවසර නොදුන් විට දෙවොල් දෙවියන් තෙද බල පෙන්වූ නිසා සත් කුමරුන්ට මෙම ස්ථානයට ගොඩ බැසීමට අවසර ලැබී තිබේ. එයට තවත් හේතුවක් වන්නේ ඉන්දියාවේ සිට පැමිණි දෙවොල් කුමරු පෙර භවයකදී පත්තිනි දෙවියන්ගේ සහෝදරයෙකු වීමයි. ඒ අවස්ථාවේදී පත්තිනි දෙවියන් ගිනිමැල හතක් මවා පෑ අවස්ථාවේදී දෙවොල් දෙවියන් ඒවා තරණය කොට තම තේජස පෙන්වා ඇති බව දේව පුරාණයේ දැක්වේ. ඒ අනුව මෙම දෙවොල් කුමාරවරු සත්දෙනා ගිනි මැල හත තරණය කරමින් මුහුදු වතුරෙන් ගිනි සිසිල් කරගෙන වැලි සහල් කරගෙන ගොඩබිම වෙත සේන්දු වූවා යැයි ද සඳහන් වේ. මෙම දේව පුරාණය පහත සඳහන් කවියෙන් ද පැහැදිලි වේ.

සිද්ධ පත්තිනිය සීනිගම දේවාලේ
සුද්ධ සීනිගම තොට වැඩසිටි එකලේ
දෙවොල් දෙවිඳු ගිනිකඳු මත වැඩිය වෙලේ
ඔහු හට භාරදීමේ ගම එකලු කළේ (ධර්මදාස සහ තුන්දෙනිය, 1994).

මෙසේ පැමිණි පිරිස කුරුම්බරයන් ලෙස ද හඳුන්වයි. අලුත් කුරුම්බර, එක්සේ කුරුම්බර, රිද්ද කුරුම්බර, මුල් කුරුම්බර, සැඩ කුරුම්බර, දළ කුරුම්බර සහ වඩිග කුරුම්බර යනුවෙන් හඳුන්වනේ ද එම දේව කුමාරවරුන් ය. ඔවුන් සියලු දෙනා ඉන් පසු රටේ විවිධ ප්‍රදේශවල පදිංචි වූ බව ද විශ්වාසය පරිදි විය. සීනිගම, පානදුර කලුවාමෝදර, ගිංතොට, අම්බලන්ගොඩ ප්‍රදේශවල මෙම දෙවිවරුන් ඇදහීම ප්‍රචලිත වී ඇත්තේ ඔවුන් එම ප්‍රදේශවල පදිංචි වූ නිසා බව ද කියැවේ (ධර්මදාස සහ තුන්දෙනිය, 1994).

සීනිගම දේවාලයේ ප්‍රධාන ලෙස ම පුද පූජා පවත්වනු ලබන දෙවොල් දෙවියන් මුහුදට අධිපති දෙවියන්, ගින්නට අධිපති දෙවියන් වශයෙන් ද හඳුන්වයි. මෙම භූමියට දෙවොල් දෙවියන්ගේ ආශිර්වාදයත් මෙම භූමියේ දෙවොල් දෙවියන් වැඩ වසන බවටත් මිනිසුන් විශ්වාස කරයි. මේ අනුව අලුත් යාත්‍රාවක් ගත් විට පමණක් නොව මාළු අස්වැන්න සරු වූ විට පවා ධීවරයන් සීණිගම දේවාලයේ දෙවියන් වෙත පැමිණෙනු ලබන්නේ දෙවොල් දෙවියන් එම භූමියේ වැඩ වාසය කරන බවට ඇති විශ්වාසය නිසාවෙනි.

දෙවොල් දෙව් රතු පටියකින් බැඳි මුතු සහිත සළුවක් පැලඳ රන් පැහැ ගත් අවානක් ගෙන සිටින බව සඳහන්ය. ගිනි වළලු මැඩලූයේ ගිනිගත් ජටා පළඳනාවක් සහ ගිනි ගිනිගත් සළුවක පිහිටෙන් බව ද සඳහන් වේ. දෙවොල් දෙවියන් ලා රෝස පැහැයක් උසුලන බවත්, බලපරාක්‍රමයන් ගෙන් අනූන බවත්, සතර බ්‍රහ්ම විහරණයන් ගෙන් යුක්ත බවත්, ප්‍රියත ම මල ඕලු බවත්, පානය තැඹිලි වතුර බවත් පෙන්වා දෙයි (මාලිමගේ, 2007, 25).

එමෙන් ම දෙවොල් දෙවියන් ඇදහීම සිදු කර ඇත්තේ දෙවොල් දෙවියන්ගේ මරණයෙන් පසුව බව අදටත් පවතින විශ්වාසය යි. තව ද මුහුදට අරක්ගත් දෙවියන් ලෙස ධීවර ජනතාව අතර වන්දනීය ගෞරවයට පාත්‍ර වන්නේ සීනිගම දේවාලයේ වැඩසිටින ශ්‍රී දෙවොල් මහා දෙවියන් ය. මෙම සීනිගම දේවාලයේ දෙවොල් දෙවියන්ට අමතරව මණිමේඛලා දෙවඟන පත්තිනි මෑණියන් කතරගම දෙවියන් විෂ්ණු දෙවියන් යන දෙවියන්ට ද දෙවියන්ටද පුද පූජා පවත්වයි.

## 3.2 සීනිගම දේවාලයේ ඇදහිලි චාරිත්‍ර හා ඒ හා සමගාමී වූ පුද්ගල චර්යා

ආගමික විශ්වාසයන් හුදෙක් මායාවක් නම් මානව ඉතිහාසය පුරා එම ආගම් සහ විශ්වාසයන් නොකඩවා පැවතිය නොහැකි බව Durkheim දක්වයි. අනෙක් අතට විවිධ මානව හිතවාදීන් සහ බුද්ධිවාදීන් පෙන්වා දෙන ආකාරයට ආගමික විශ්වාසයන් හුදු සාවද්‍යතාවන් (errors) නොවන බව ද ඩර්කයිම්ගේ තර්කයයි (Durkheim, 1912; Lukes, 1985). එමෙන් ම ඒ වටා ගොඩනැගෙන ඇදහිලි සහ විශ්වාස මිනිසුන්ගේ සදාචාර සම්පන්නකම කෙරෙහි නියතව හා සෘජුව බලපාන අතර ඔවුන්ගේ ආරක්ෂාවත් සමාජය තුළ පැවැත්මත් එමගින් සාක්ෂාත් කරගනු ලැබේ.

ඒ අනුව සීනිගම ශ්‍රී දෙවොල් මහා දේවාලයේ සිදුකරන්නාවූ පුද පූජාමය යාතුකර්ම කටයුතු ගත්විට එය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදා වෙන් කළ හැකිය. එනම් දෙවියන් සඳහා වන බාරහාර කටයුතු හා සම්බන්ධ පුද පූජා කටයුතු, සහ පළිගැනීම් ශාප කිරීම් හා සම්බන්ධ කටයුතු. ඒ අනුව සීනිගම ශ්‍රී දෙවොල් දෙවියන් සම්බන්ධව පවතින විශ්වාසයන් පදනම් කොටගෙන ඒ හා සමගාමීව යාතුකර්ම ගොඩනැගී ඇත. Bell (1997) පෙන්වා දී ඇති ආකාරයට යාතුකර්ම ප්‍රධාන වශයෙන් වර්ග 5ක් පවතින අතර යාතුකර්ම පහ අතරින් සීනිගම දේවාලය තුළ සිදුකරන යාතුකර්ම ප්‍රධාන යාතුකර්ම ත්‍රිත්වයකට අයිති වන බව පැහැදිලි කර ගත හැකිය. එනම්

- විවිධ කාලානුරූපිව කරන යාතුකර්ම
- මනෝමය තත්ත්වයන් මත පදනම් වූ යාතුකර්ම
- ගනුදෙනු මත පදනම් වූ යාතුකර්ම
  වශයෙනි.

### 3.2.1 විවිධ කාලානුරූපිව සිදු කරන යාතුකර්ම

එහිදී විශේෂයෙන් ම විවිධ කාලානුරූපීව කරන යාතුකර්ම ලෙස ප්‍රධාන වශයෙන් සීනිගම දේවාලයේ වාර්ෂිකව පවත්වන ඇසළ මහා පෙරහර පෙන්වාදිය හැකිය. විනෝද ආඥා පනත යටතේ ජාතික උත්සවයක් වශයෙන් ගැසට් කරන ලද සීනිගම ශ්‍රී දෙවොල් මහා දේවාලයේ වාර්ෂික ඇසළ මහා පෙරහැර පුණ්‍යෝත්සවය පවත්වයි. එහිදී කප් සිටුවීම සිදුකොට සර්ව රාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනාවක් පවත්වා හීල් දානය පිරිනමා පසුව දේවාභිෂේක නානුමුර මංගල්‍යය පවත්වනු ලබයි. අවසානයේ පෙරහැර අගෝස්තු මස අවසන් භාගයේ සිට සැප්තැම්බර් මුල් සතිය දක්වා පැවැත්වෙයි. එය දිවා මහා පෙරහරවල් ද්විත්වයකින් ද රාත්‍රී මහා පෙරහැරවල් ද්විත්වයකින් ද සමන්විත වේ. එය ඉතා උත්කර්ෂවත් අන්දමින් පවත්වන අතර අලි ඇතුන් නර්තන කණ්ඩායම් මෙන් ම දෙවොල් දෙවියන්ගේ ආනුභාවය ප්‍රකට කරන්නා වූ විවිධ චාරිත්‍රයන් ද මෙම පෙරහැරට අන්තර්ගත වේ. ඉන් පසුව දෙවොල් මඩු යාගය පවත්වා ගිනි පෑගීම සිදුකොට පසුව සියලු ම බැතිමතුන් හට දේව දානය ලබා දීම සිදු කරයි. අවසානයේ සියලු ම පෙරහර සම්ප්‍රදායන්ට අනුකූලව දිය කැපීමේ මංගල්‍යයකින් පෙරහැර කටයුතු අවසන් කරයි.

එමෙන් ම 2004 වසරේ සුනාමි රළ පහර සීනිගමට පැමිණියත් මුහුදු වෙරළෙහි ම පිහිටා තිබෙන දේවාලයට එයින් එතරම් සැලකිය යුතු හානියක් නොවීම දෙවොල් දෙවියන්ගේ හාස්කමක් ලෙස ජනතාව සලකති. මේ දේවාලය ආශ්‍රිතව සුනාමි ව්‍යසනයෙන් පසු ඇති වූ විශේෂ උත්සවයක් ලෙස කුරුඳු මංගල්‍යය හැඳින්විය හැකි අතර සුනාමියෙන් පසු මේ ප්‍රදේශයේ කුරුඳු වගාව නැවත නගා සිටුවීම සඳහා එම වගාකරුවන් දෙවොල් දෙවියන්ට වූ බාරයක් හේතුවෙන් මෙය පවත්වයි. එය සෑම වසරක ම දෙසැම්බර් මාසයේ දී පැවැත්වේ (සමරවීර, 2021).

ශ්‍රී ලාංකික සමාජයේ ආගම තේරුම් ගැනීමට ආගමට අදාළ ඇදහිලි ආකෘතිය වැදගත් වේ. එහි ප්‍රධාන ලක්ෂණ හතරක් පවතී. එනම්, සියලු ම ජන කණ්ඩායම් විසින් එක් වස්තුවක් ශුද්ධ ලෙස සැළකීම, එම සමූහයේ සියලු ම දෙනා එම ආචාර ධර්ම පිළිපැදීම, එම සමූහයේ සියලු ම දෙනා එක සමාන යාතු කර්මවල යෙදීම හා එක් සමූහයක් ලෙස පෙනී සිටීමයි. අදාළ පර්යේෂණ ක්ෂේත්‍රයෙහි මෙම සාධක මැනවින් ප්‍රකට විය. විශේෂයෙන් ම එහිදී මෙම සීනිගම වාර්ෂික ඇසල පෙරහැර මංගල්‍යය ඉතා වැදගත් වේ. ඒ අනුව එහි පවත්වන පූජා විධි රටාවන් කිහිපයක් ම හඳුනාගත හැකිවිය. දෛනික පූජා විධි රටාවන්ට අමතරව සතිපතා, මාසිකව හා වාර්ෂිකව පවත්වන පූජා රටාවක් පවතී. මානව විද්‍යාඥයෙකු වන Mircea Eliade දක්වන ආකාරයට ඕනෑම ආගමක තිබෙන කිසියම් ශුද්ධ වස්තුවක් පිළිබඳව අවධානය යොමු කළ හැකි අතර, එම වස්තුව පදනම් කරගෙන පුද පූජා, වතාවත්, පිළිවෙත් පවත්වනු ලැබේ (Allen, 1972). එසේ ම, ආගමක් හඳුනාගැනීමේ දී මිනිසුන් තුළ ආගමික හැඟිම් වර්ධනය වීම මූලිකව ම සිදුවන බව කියැවේ. ඒ අනුව එකී ආගමික හැඟීම් පිළිබිඹු වන ප්‍රධාන ආකාර වශයෙන් මෙකී ආගමික පුද පූජා විධි හඳුනාගත හැකිය.

### 3.2.2 මනෝමය තත්ත්වයන් මත පදනම් වූ යාතුකර්ම

Bell (1997) පෙන්වා දෙන ආකාරයට මෙහිදී සිදුවන්නේ ශරීරය භාවිත කර තමන්ගේ හැඟීම් දැනීම් ශක්තිය ප්‍රකාශ කිරීමයි. එය බැතිමතුන්ට මානසිකමය වශයෙන් භක්තියක්, සහනයක් මෙන් ම මානසික සුවයක් ද ඇති කරදෙන බව පෙන්වාදෙයි. සීනිගම දේවාලය ආශ්‍රයෙන් එය ගත්විට විශේෂයෙන් ම  ගිනි පෑගීමේ චාරිත්‍රය  මේ හා සම්බන්ධ කොට ගත හැකිය (රූපසටහන 01) . පත්තිනි මෑණියන් මැවූ ගිණි කඳු හත පාගා නිවා දමා ගොඩබිමටආ බවට විශ්වාස කරන අතර මෙම ගිණි පෑගීමේ පූජා කර්මයේ ආරම්භය ලෙස ද මෙය සැලකේ. එය ගිණි පෑගීමේ දී ගායනා කරන කවි අනුව ද පැහැදිලි වේ. එයින් එක් කවියක් පහත පරිදී පෙන්වා දිය හැකිය.

නොදා තියන ගඟ දිය මෙන් සිහිල්　　වෙවී
උදාර යෙන් පැන ගිනි මැදට සැක　　තෙවී
අ දා සිතින් ගොඩබටු  අණසක　　බෝවී
එදා පතිනි නම් තැබුවේ දෙවොල්　　දෙවී　　(ධර්මදාස සහ තුන්දෙනිය, 1994).



**රූපසටහන 01:** ගිනි පෑගීම සඳහා සූදානම් කරන ලද දේවාල භූමිය

ඩර්කයිම් ප්‍රකාශ කරන ආකාරයට "කිසියම් සමාජයක ඒකාග්‍රතාවය, සාමූහික විඥානය වර්ධනය කිරීම ආගමේ ප්‍රධානතම සමාජ කෘත්‍යයක්" වේ (ජයසිංහ, 2013: 160). ඒ අනුව පොදු විශ්වාස මත සිදු කරනු ලබන පුදපූජා විධිවලදී පොදු අනන්‍යතාවය වර්ධනය වන බවත්, තමා සමූහයක කොටස්කරුවෙක් ය යන හැඟීම ද වර්ධනය වන බව කිව හැකි ය.

### 3.2.3 ගනුදෙනු මත පදනම් වූ යාතුකර්ම

ගනුදෙනු මත සිදුකරන යාතුකර්ම සෘජුව ම අධිමානුෂික බලවේග සමඟ ගනුදෙනු කරන යාතුකර්ම වේ. ඒ අනුව පඬුරු ගැට ගැසීම භාරවීම පින් ලැබීම සහ ආරක්ෂාව පතා පුද පූජා කිරීම ආදිය පෙන්වා දිය හැකිය (Bell, 1997). මේ හා සම්බන්ධව ගත් කල සීනිගම ශ්‍රී දෙවොල් මහා දේවාලය තුළ ද අති විශාල වශයෙන් ගනුදෙනු මත පදනම්ව සිදු කරන යාතුකර්ම සිදු වෙනු දක්නට ලැබේ. විශේෂයෙන් ම පුද්ගලයන්ගේ දුක්ගැනවිලි මත පදනම් වූ බාරහාර මෙන් ම ඔවුනට සිදු වූ අසාධාරණයක් හේතුවෙන් පලිගැනීම් නැතහොත් දේව ශාපයන් යැදීම ප්‍රධාන වශයෙන් සිදුවේ. එහි ප්‍රධාන පාර්ශ්වකරුවන් ලෙස බැතිමතා, කපුරාළ සහ දෙවියන් මෙන් ම දෙවියන් හා සම්බන්ධ වන යක්ෂයන් පෙන්වා දිය හැකිය. මෙම කාර්යය තුළ දෙවියන්ට මෙන් ම යක්ෂයන්ට බැතිමතාගේ පණිවිඩය ගෙන යන අතරමැද පාර්ශවය ලෙස ක්‍රියා කරනු ලබන්නේ කපුරාළ වේ. එය එක්තරා ආකාරයක ගනුදෙනුවකි. ඒ ගනුදෙනුව හා සමගාමීව ඔවුන් අතර සෘජු සහ වක්‍ර අන්තර් සම්බන්ධතාවක් ද අන්තර් ක්‍රියාවලියක් ද සිදුවීම පැහැදිලි ව හඳුනාගත හැකිය. එය කපුරාල මහතුන් සමඟ කරන ලද පහත ප්‍රකාශයන්ගෙන් තවදුරටත් සනාථ වේ.

*''දෙවොල් දෙයිහාමුදුරුවන්ට සිද්ධ කරන හැම බාරහාරයක් ම, මිනිස්සුන්ගෙ අඬෝවැඩියාවල් දෙයි හාමුදුරුවන්ට කියලා කන්නලව් කරලා සෙතක් ශාන්තියක් ගේන වැඩේ කෙරෙන්නේ අපේ පැත්තෙන් තමයි''* (සම්මුඛ සාකච්ඡා -1, 2022).

*''මං කපු මහත්තයෙක් විදියට මිනිස්සු ගේන ප්‍රශ්නවලට පිළිතුරු සපයා දෙන්න පිහිට වෙනවා''* (සම්මුඛ සාකච්ඡා -2, 2022)

මේ ආකාරයෙන් සීනිගම දෙවොල් මහා දේවාලයේ සිදුවන සියලු ම ගනුදෙනුමය යාතුකර්ම ඉතා සුවිශේෂී ස්ථානයක් හොබවයි. මන් ද යත් එය පැහැදිලිව ම ආකාර දිවිත්වයකට සිදුවන නිසාවෙනි. එනම්,

1. බාරවීම් (Waw)
2. ශාප කිරීම් (Cursing)

#### 3.2.3.1 බාරවීම් (Waw)

දෙවියන්ට බාරවීමට, පුද පූජා පැවැත්වීමට කැමති අය වෙරළේ ඇති සිද්ධස්ථානයට පැමිණෙති. මෙම සීනිගම දේවාලයේ ප්‍රධාන වශයෙන් බාර හාර පුද පූජා හා යාතුකර්මවලට සහභාගි වන පිරිස අතර ධීවර ප්‍රජාව ප්‍රධාන වේ. එහිදී ඔවුන් මුහුදු යාමට පෙර පුරුද්දක් වශයෙන් සීනිගම දේවාලය වෙත පැමිණ තමන්ගේ සියලුම කටයුතු දෙවියන් වෙත බාර කරවා දීම හඳුනාගත හැකි ප්‍රධාන කාරණයක් විය. එහිදී තමන්ගේ ආර්ථික අභිලාෂයන් මුදුන් පමුණුවා ගැනීම සඳහා දෙවියන්ගේ ආශිර්වාදය ලබා ගැනීම ඔවුන්ගේ මූලික පරමාර්ථය විය. එමෙන්ම තමන් දියඹට ගොස් ආපසු නිවසට පැමිණෙන තෙක් සියලු ම බාධාවන් දුරලා අඹු දරුවන් ද ආරක්ෂා කොට දෙන ලෙස ඔවුන් දෙවියන්ගෙන් ඉල්ලා පුද පූජා බාර හාර පවත්වනු දැකිය හැකි විය. ඒ බව පහත ක්ෂේත්‍ර දත්ත ඇසුරින් තව දුරටත් සනාථ කර ගත හැකි ය.

*''මුහුදු රැකියාව කරන හැම පුද්ගලයෙක් ම ඇත්තට ම බොහෝ භක්තියකින් ඇවිල්ලා මං හිතන්නේ හම්බන්තොට කතරගම පැත්තෙ ඉඳගෙන බේරුවල පැත්තේ අය තමන්ගේ මුහුදු රස්සාවට යන්න කලින් මෙතැන පූජාවක් තියල බාර වෙලා තමයි යන්නේ. තමන්ට ආරක්ෂාව සලසලා දෙන්න කියලා තමන්ට මත්ස්‍ය සම්පත් ලබා දෙන්න කියලා, ගෙවල් දොරවල් ආරක්ෂා කරලා දෙන්න කියලා බාර කරලා දරුමල්ලන් ආරක්ෂා කරලා දෙන්න කියලා බාර කරලා, ඒ බැතිමත් ඉල්ලීම ඉල්ලලා තමයි මුහුදු රස්සාව කරන්න යන්නේ ''* (සම්මුඛ සාකච්ඡා - 3, 2022).

මේ අනුව තමන්ගේ ආර්ථිකමය අභිමතාර්ථයන් සාක්ෂාත් කරගනු වස් දෙවොල් දෙවියන් වෙත බාර හාර වී තම රැකියා කටයුතු ආරම්භ කිරීම ධීවර ප්‍රජාවගේ ආත්ම විශ්වාසය ඉහළ නැංවීම, මෙන් ම අවදානම් සහගත බව සමනය කිරීමට අවශ්‍ය වන්නා වූ මානසිකමය සූදානමක් ඒ පූජා පැවැත්වීම තුළින් අපේක්ෂා කරන බව පෙන්වා දිය හැකි ය. එමෙන් ම ධීවර ජනතාව දෙවොල් දෙවියන් සඳහා වන ලද භාරහාර ඔප්පු කිරීම සඳහා ද නොවරදවා ම දෙවොල් දේවාලය වෙත පැමිණීම දැක ගත හැකි විය. එය පහත ප්‍රකාශවලින් තවදුරටත් පැහැදිලි වේ.

*''බහුදින යාත්‍රාවකින් අපි මුහුදු ගියේ. ලංකාවේ ඉදලා නාවික සැතපුම් අසූ එකක් වගේ දුරින් තමයි අපේ යාත්‍රාව තිබ්බේ. එකපාරට ම අහස කළු කරලා තද හුළඟක් හමාගෙන ගියා. ඒත් එක්ක ම මාරියාවට බෝට්ටුව අහුවුණා. අපිට ඒ වෙලාවෙ ඇත්තටම මරණ බය දැනුණා. මේ වෙලාවේ අපි ඔක්කොම එකතු වෙලා දෙවොල් දෙවියන්ට බාර වුණා. අපේ ඔක්කොගෙම ජීවිතේ බේරලා දුන්නොත් ආලෝකයත් එළියත් ලබා දෙනවා කියලා. වාසනාවකට අපේ ජීවිත බේරුණා. දෙවොල් දෙවියන්ට ඒ ආලෝක පූජාව කරලා ඒ බාරය ඔප්පු කරන්න තමයි අපි ආවේ''* (සම්මුඛ සාකච්ඡා -4, 2022).

*''දෙවොල් දෙවියන් මුහුදට ඇති වස්තූන්වලට අරක්ගත් දෙවියෙක්. පලතුරු පූජා වට්ටියක් අරන් ගිහිල්ලා,දෙවොල් දෙවියන්ට බාර වෙලා රතුපාට රෙදි කඩක ගැටගහපු පඬුරක් කපු මහත්තයට දීලා බාර වෙලා තමයි මුහුදු යන්නේ මුහුදු රකුසාගෙන් ආරක්ෂා කර දෙන්න කියලා තමයි අපි බාර වෙන්නේ''* (සම්මුඛ සාකච්ඡා -5, 2022).

*''කොටින් ම කිව්වොත් මෙහි ඉන්න ජී ධීවරයන්ගේ ජන ජීවිතය හා බැඳිලා තියෙන්නේ දෙවියන්. ඒ හින්දා ධීවරයන්ගේ අතර දෙවියන් පිළිබඳ පිළිබඳව තියෙන විශ්වාසය ඉතා ම විශාලයි. ඒත් එක්ක ම මේ ධීවර ජනතාව දෙවියන් වගේ ම යක්ෂයන් විශ්වාස කරනවා ඒ හින්දා විවිධ යාතුකර්ම ධීවරයන්ගේ ජීවිතය හා බැඳිලා තියෙනවා. ඒත් එක්ක ම කතරගම, විෂ්ණු, උපුල්වන් වැනි දේව විශ්වාස එම දෙවිවරුන්ට කෙරෙන යාතුකර්ම ධීවරයන් විසින් කරනවා''* (සම්මුඛ සාකච්ඡා - 6, 2022).

ධීවර කර්මාන්තයට ගරා යක්ෂයාගේ ආශිර්වාදය ලබා ගැනීම සඳහා ජනතාව විසින් චාරිත්‍රානුකූලව යාතුකර්ම පවත්වනු ලබයි. හිරු බැස ගත් අන්ධකාරය පැතිරෙත් ම යකැදුරු විසින් මන්ත්‍ර කියා පේ කරන ලද ආහාර පුරවන ලද බෝට්ටු ඇදී යත්ම වෙරළේ තැනින් තැන සිටින ධීවරයෝ හුළුඅතු දල්වාගෙන තමාගේ පිදේනිය රැගෙන යන බෝට්ටුව මුහුදට ඇදී යනු බලා සිටිති. එහෙත් ඔවුහු කිසිදු ශබ්දයක් කරන්නේ නැතිව නිහඬව බලා සිටින්නේ ඝන අන්ධකාරය විසින් ගිල ගන්නා ලද තම බෝට්ටුවෙන් දුම් සහිත කහ පැහැති ආලෝකය අහසට පැන නගින තෙක් ය. ඒ අනුව ධීවරයෝ ගරායක් නැටුම් ද සූදානම් කරති. ගරායක් නැටුම ට අමතරව ගම්මඩු යාගය, දෙවොල් යාගය ධීවරයන් විසින් සිදුකරන යාතු කර්මයන් ය. දෙවොල් දෙවියන් ගැන විශේෂයෙන් සඳහන් කළ යුතු ය. ධීවරයන්ගේ ආරක්ෂාව සලසන්නේ දෙවොල් දෙවියන් බව ඔවුන්ගේ විශ්වාසයයි.

එහිදී Schultz සහ Lavenda (1990) උපුටාගනිමින් Grau (2001) පෙන්වා දෙන ආකාරයට මෙවැනි යාතුකර්ම ද නැවත නැවත සිදුවන මිනිස් ක්‍රියාකාරකම් හා සම්බන්ධ වේ.

එමෙන් ම එදිනෙදා ජීවිතයේ කරන දේවල්වලට වෙනස් දෙයක් ලෙස ඒවා පැවැත්වෙයි. ඒවා සිදු කරන නිශ්චිත පිළිවෙලක් පවතී. එමෙන් ම යාතුකර්ම ආගමික මිත්‍යාත්මක දෙයකට සම්බන්ධව පවතී. අපි සියලු ම කාරණා දෙවොල් දෙවියන් හා සම්බන්ධව යාතුකර්ම තුළ අන්තර්ගත ය. යාතුකර්ම ආගමින් එහාට ගොස් ගොඩනැගී ඇත.

Durkheim (1912) උපුටා ගනිමින් Lukes (1985) පෙන්වා දෙන්නේ විනය කර්මයේ දී ආගමික චාරිත්‍ර වාරිත්‍ර මගින් මිනිසුන්ව සමාජ ජීවිතයට සූදානම් කරන්නේ ස්වයං විනය පැනවීම මගින් බවයි. සාමූහික ක්‍රියාවන්හිදී ආගමික උත්සව මගින් මිනිසුන් එක්රැස් කරන අතර එමගින් ඔවුන්ගේ පොදු බැඳීම් යළි තහවුරු කිරීමට සහ සමාජ සහයෝගීතාව ශක්තිමත් කිරීම සිදුකරයි. ආගමික පිළිපැදීම සජීවී සම්පන්න කිරීමේ කාර්යයේ දී සමූහයේ සමාජ උරුමයන් පවත්වා ගෙන යමින් පුනර්ජීවනය කරන අතර එහි කල්පවත්නා වටිනාකම් අනාගත පරම්පරාවට සම්ප්‍රේෂණය කිරීමට උපකාරී වේ.

අවසාන වශයෙන්, ඇදහිලිවන්තයන්ගේ යහපැවැත්ම පිළිබඳ හැඟීම, ඔවුන් සිටින සදාචාරාත්මක ලෝකයේ අත්‍යවශ්‍යතාව පිළිබඳ ඔවුන්ගේ හැඟීම නැවත ස්ථාපිත කිරීම මගින් බලාපොරොත්තු සුන්වීම සහ ඇදහිල්ල හා විශ්වාසය නැතිවීමේ හැඟීම්වලට එරෙහිව කටයුතු කිරීමට ආගම කෘත්‍යාත්මක කාර්යයක් ඉටු කර ඇත.

මේ පමණක් නොව දෙවොල් දෙවියන් වෙත බාර හාර පුද පූජා පැවැත්වීම සඳහා සාමාන්‍ය ජනතාව ද හා විශාල වශයෙන් සීනිගම දේවාලය වෙත පැමිණෙති. ඒ අතර දෙස් විදෙස් ජනතාව ද, නොයෙකුත් ආගම් නියෝජනය කරන ජනතාව ද වෙති. ඔවුන් මේ දේවාල භූමියට පැමිණීමට හේතුව වන්නේ ඒ විශාල හාස්කම් තිබෙන බවට ජනතාව විශ්වාස කිරීමයි. එනම් අධි භෞතික සංකල්ප මත පදනම් වූ විශ්වාසය මේ දේවාල භූමියට ජනතාව එක්රැස් වීම සඳහා මූලික ම හේතු සාධකය බව ද පෙන්වා දිය හැකි ය. එය කපු මහතෙකු විසින් සිදුකරන ලද පහත ප්‍රකාශයෙන් තවදුරටත් සනාථ වේ.

*''හාස්කම් කියන්නේ අපිට පේන දේවල් නෙවෙයි ඒවා විශ්වාස කරන දේවල්. දැන් මං ඔබතුමිය එක්ක කතා කරන වෙලාවේ දේවාලේ විශාල පිරිසක් එකතු වෙලා ඉන්නවා. ඒ බාරහාර වෙලා භක්තියෙන්, ඒ මිනිස්සුන්ගේ ප්‍රාර්ථනා ඉෂ්ට වෙලා ඉඩමක් කඩමක් ගන්න ආවත්, යාන වාහනයක් ගන්නා ආවත් ඒ බලාපොරොත්තු ඉෂ්ට වුණ අය. අනිත් එක තමයි තමන්ගෙ වෙනත් ලෙඩ රෝගයක් තිබුන අය සනීප වෙලා එනවා මෙහෙට බාර වෙලා ගියාට පස්සෙ. ඇත්තටම මං අහල අහලා තියෙනවා දැකලා තියෙනවා බලලා තියෙනවා.මේ පොඩි ළමයි මෙතනට ගේනවා හදවතේ සිදුරු තියෙන. එතකොට මං දැකලා තියෙනවා එක එක විදේශිකයන් ඇවිල්ලා එයාලගේ පිළිකා රෝගී තත්ත්වයන්ට බාරහාර වෙලා තියනවා''* (සම්මුඛ සාකච්ඡා - 7, 2022).

මෙහිදී Abubakar (2013) සහ පිරිස උපුටා ගනිමින් Eley සහ පිරිස (2019) දක්වන ආකාරයට සෞඛ්‍ය යහපැවැත්මට ආගමික අධිභෞතික විශ්වාස ඇතුළත් කර ඇති ආකාරය හඳුනාගත හැකි ය. ඒ අනුව සීනිගම දේවාලයෙහි වන බාර හාර අතර පුද්ගල සෞඛ්‍ය සම්බන්ධ බාරහාර වීම්වලට ද ප්‍රසිද්ධ බව පෙන්වා දිය හැකි ය.

එහිදී විශේෂයෙන් ම පුද්ගලයාගේ මානසික වශයෙන් වන සුවතාවය උදෙසා එය මහගු පිටිවහලක් ද වේ. එය ආගමික යාතුකර්ම යන්ගේ කෘත්‍යයක් ලෙස පෙන්වා දීම ද සාවද්‍ය නොවේ. එනම් අධ්‍යාත්මික හා මානසික යහපැවැත්ම සංස්කෘතික වශයෙන් තීරණය වන බව (Udayanga, 2021) හඳුනාගත හැකි ය.

මේ අනුව සීනිගම දේවාලයේ ආගමික යාතුකර්මයක් වශයෙන් සිදුකරන බාර හාර සහා ඒවාට සහසම්බන්ධවන පුද්ගල අරමුණු සැකසී ඇති ආකාරය සාකච්ඡාවට ලක් කළ හැකි ය.

### 3.2.3.2 ශාප කිරීම් (Cursing)

ශාප කිරීම මන්තර ගුරුකම් හා සමාන නොවේ වෙනත් ආකාරයකින් කිවහොත් ශාප කිරීම කළු අභිචාර (කොඩිවින) ගනයට අයත් නොවන බව Feddema (1997) පෙන්වා දෙයි. සීනිගම ඇත්ත වශයෙන්ම පොදු සිද්ධස්ථානයක් වන නමුත් එය මන්තර ගුරුකම් සිද්ධස්ථානයක් නොවන බව ද ඔහුපෙන්වා දෙයි. ශාප කිරීම යන්න මන්තර ගුරුකම්වලින් හඳුනාගත නොහැක. මන්ත්‍ර ගුරුකම් හා සසඳන විට ශාප කිරීම සුළු දෙයක් බව ද දක්වයි. මේ දෙක අතර විශාල වෙනස්කම් තිබේ.

ශාප කිරීම වචනයෙන් සහ මුඛයෙන් සිදු වන අතර මන්තර ගුරුකම් අතින් සිදු කරන ක්‍රියාවක් වේ (Feddema, 1997). ශාප කිරීමේ ක්‍රියාවලියේදී කෙනෙකු දෙවියෙකුට කන්නලව් කරන අතර යක්ෂයන්ගේ උපකාර ලබා ගැනීමට උත්සාහ කරයි.

ශාප කිරීම සහ මන්ත්‍ර ගුරුකම් සමාන නොවේ. ශාප කිරීම කපුවා විසින් මෙහෙයවනු ලබන අතර මන්ත්‍ර ගුරුකම් සිදු කරනු ලබන්නේ කට්ටාඩියා විසිනි. කපුවා මැදිහත් වන්නේ දෙවියන් වහන්සේ සහ ශාප කරන්නා අතර පමණි. මන්ත්‍ර ගුරුකම් නිසා ආබාධිත තත්ත්වයට පත් විය යුතු පුද්ගලයා නම් බොහෝ විට සඳහන් වන අතර බොහෝ විට ලියා ඇත. ප්‍රහාරය ඍජු වන අතර, ශාපයේ ක්‍රියාවලියේදී චෝදනාව බොහෝ විට වක්‍ර වේ (Feddema, 1997). මන්තර ගුරුකම් බොහෝ දුරට ප්‍රචණ්ඩ චක්‍රයක් ආරම්භ කරන අතර ශාප කිරීම එයට ප්‍රතිවිරුද්ධ දෙය කරයිඃ එනම් ශාප කිරීමෙන් පසු ප්‍රචණ්ඩ චක්‍රය නතර කරයි.

Feddema (1997) දක්වන ආකාරයට ශාප කිරීම යන්න ප්‍රචණ්ඩත්වය ලෙස දැකිය යුතු දෙයක් පමණක් නොව, පුද්ගලයා පාලනය කර ගැනීමට උපකාර වන ආගමික නාලිකාවක් ලෙස ද පෙන්වා දෙයි. Girad (1984) උපුටා ගනිමින් Feddema (1997) පෙන්වා දෙන්නේ ශාප කිරීම ප්‍රතිපත්තිමය වශයෙන් පළිගැනීම මූර්තිමත් කිරීමක් ලෙස ය. ප්‍රති-ශාප කිරීමක් එතුළ සිදුවන්නේ නැත. එයිදී වරදක් කළ තැනැත්තාට නැවත පළිගැනීමට නොහැකි වනු ඇත, මන්ද ඔහු හෝ ඇය වරදකාරි හැඟීමක් ඇති කරගන්නා අතර එය දෙවියන්ගෙන් දඬුවම් ලැබීමෙන් වැඩි වන බව එහි අර්ථය වේ. මන්ත්‍ර ගුරුකම් පුද්ගලයින්ගේ ආක්‍රමණශීලී ආවේගයන් ඇවිලීමක් විය හැකිය (Obeysekere, 1975). කෙසේ වෙතත් ශාප කිරීම ස්වභාවයෙන්ම භෞතික ප්‍රචණ්ඩත්වය පාලනය කිරීම සඳහා වන ආගමික මාර්ගයකි.

ශාප කිරීම මායා කර්මයක් සේම ප්‍රචණ්ඩත්වයේ ආකාරයක් බවට සැකයක් නැත. එබැවින් දෙවොල් දෙවියෝ ඍජුව ම පළිගැනීමේ ප්‍රචණ්ඩත්වය සිදු නොකරන බව තේරුම් ගත හැකිය. ඔහු දිවි යකාට ඔහු වෙනුවෙන් අශුද්ධ වැඩවල නිරත වීමට ඉඩ දෙයි (Feddema, 1997). මේ අනුව දෙවියන් ඇදහිලිවන්තයාට වරදින් ගැලවීමට උදව් කරන්නාක් මෙන් දිවි යක්ෂයාගෙන් උපකාර ඉල්ලයි.

බැනීමට, එන අය දිවයිනට යති. මුහුද රළු වුවහොත් එහි යාමට හෝ ටික වේලාවක් බලා සිටීම ඔවුන්ට කරදරයක් විය යුතු ය. එය නිල බෞද්ධ ලෝකයෙන් පිටත ය. ශාප කිරීම සීනිගම ප්‍රදේශයේ සියවස් ගණනාවක් පැරණි සම්ප්‍රදායක් ය. මේ වන විට කුඩා දිවයිනේ දිනකට ශාප කිරීම් වැඩි ප්‍රමාණයක් සිදු වේ. සාමාන්‍ය පූජා හෝ බාර සඳහා පැමිණෙන සාමාන්‍ය මිනිසුන් සංඛ්‍යාවට වඩා බොහෝ වැඩිය (Feddema, 1997). සාම්ප්‍රදායිකව බදාදා සහ සෙනසුරාදා ශාප කිරීම සඳහා සුදුසු දිනයන් වන නමුත් අද වන විට ඉල්ලුම ඉතා විශාල බැවින් එය එම දින දෙකට සීමා කළ නොහැකි බව ද සඳහන් වේ. කෙසේ නමුත් පොහොය දිනයන්වලදී ශාප කිරීම සිදු නොවේ.

සීනිගම දෙවොල් දේවාලයේ ඉතා ප්‍රසිද්ධ මෙවන් ශාප කිරීම් හා සම්බන්ධ යාතු කර්මවලට හේතු වන්නේ තමන්ට සිදුවූ අසාධාරණයන් පිළිබඳ දෙවියන් විවිධ ඉදිරියේ

තම දුක කියන්නට කන්නලව් කරන්නට ආශීර්වාද ලබාගැනීමට මිරිස් ඇඹරීමට හා පොල් ගැසීමට දිවයිනේ නන්දෙසින් විශාල පිරිසක් මේ දේවාල පුදබිම වෙත පැමිණීමයි. විශේෂයෙන් සීනිගම ගම්මානයේ දෙවොල් දෙවියෝ මිනිසුන්ට සේවය කරන්නේ දඬුවම් දීමෙන් සහ විශේෂිත පුද්ගලයන්ට ශාප කිරීම සම්බන්ධ වෙනත් ප්‍රචණ්ඩ ක්‍රියා මගිනි. එය පහත කපු මහතෙකු දී ඇති ප්‍රකාශයෙන් තවදුරටත් පැහැදිලි වේ.

*''ඇත්තටම මිනිස්සු අසරණ වෙලා ඉන්න වෙලාවට මේ දේවාලයට ඇවිල්ලා සහනයක් පතනවා. හැබැයි ඒ වගේම තමයි දෙවියන්ට අගෞරව කරන හැම කෙනෙකුටම දේව දඬුවම් වලට ලක් වෙන්න සිද්ධ වෙනවා. මොකද දෙවොල් දෙවියෝ කියන්නේ බොහොම බලගතුයි. අපේ පොත්පත්වල තියෙනවා දෙවොල් දෙයි දෙයි හාමුදුරුවොන්ට දෙවොල් යකුන් යක්ෂණියන් පිරිවරාගෙන ජීවත් වෙන්නේ කියලා. ඒ හින්දම තමයි මිනිස්සුන්ට වෙන විවිධ අසාධාරණවලට ඒ වැරදිකරුවන්ට පලි ගහන්ඩ සීනිගමට මිනිස්සු එන්නෙ''* (සම්මුඛ සාකච්ඡා -8, 2022).

මෙහි පැමිණෙන බැතිමතුන් අතර දේශපාලනඥයින් ව්‍යාපාරිකයින් දමිළ ජාතිකයන් සිංහල බෞද්ධයන් ධීවරයන් ඇතුළු බොහෝ බැතිමතුන් පිරිසක් වේ. එහිදී තෙල්, මල් හඳුන්කූරු කපුරු ඔවුහූ රැගෙන එති. මිරිස් ඇඹරීම මේ දේවාලයට විශේෂ ආවේනික කටයුත්තකි. මිරිස් ඇඹරීමට එන පුද්ගලයන් එහි පවතින මච් ගල හෙවත් මිරිස් ඇඹරීම සඳහා යොදා ගන්නා ගෝලාකාර ගලකින් රැගෙන එන ලද සැර පහකින් යුත් වියළි මිරිස්, ගම්මිරිස්, අබ, අමු ඉඟුරු යනාදිය ගෙනැවිත් එම ද්‍රව්‍ය එකට දමා අඹරමින් මා වෙත නොව ප්‍රතිවිරුද්ධ දෙසට අඹරමින් තමාට වූ අසාධාරණය දෙවියන් වෙත යොමු කිරීම සිදු කරයි (රූපසටහන 02). සීනිගම වසර ගණනාවක් තිස්සේ මිනිසුන් ශාප කිරීම සඳහා භාවිතා කළ අයගේ සිත් තුළ දැන් විශේෂ බලයක් ඇත. මෙම ආයතනයේ වැදගත් ම අංගය වන්නේ ශාප නිෂ්පාදනයයි. එය වාචිකව සිදු කරනු ලැබේ. සේවාදායකයාට ඔහු හෝ ඇය අසල වාඩි වී සිටින කපුවා විසින් උපදෙස් දෙන ලද ඔහුගේ හෝ ඇයගේ ශාපයේ වචන උච්චාරණය කළ යුතු ය. Feddema (1997) දක්වන ආකාරයට කපුවා මුලින් ම සේවාදායකයා නොදැනුවත්ව ම විරුද්ධවාදියාට අවශ්‍ය දේ ඔහු පවසයි: මරණය, බරපතල මානසික රෝගයක්, අනතුරක්, කකුල් කැඩීම හෝ පදිංචි ගම හැර යාමට බල කිරීම සිදු කරයි.



**රූපසටහන 02:** මිරිස් ඇඹරීම

එහිදී අදාළ පැමිණිල්ල දෙවියන් වෙත ඉදිරිපත් කරනු ලබන්නේ දේවාලයේ කපු මහතා විසිනි. එහිදී ඔවුන් භාවිත කරන භාෂාව ඉතා රළු ස්වභාවයක් උසුලයි. එහිදී විශේෂයෙන්

ම තරහව, වෛරය, පළිගැනීමේ ස්වභාවය සහ ද්වේශ සහගත බව පෙන්නුම් කරයි. ඒ ආකාරයෙන් වන භාෂාව භාවිතය පහත පරිදි පෙන්වා දිය හැකි ය.

*''මගේ ඇගේ ලේ හෙලෙව්ව හතුරෝ හැතිරියෝ, මේ මොහොතේ පටන් දිවි යක්ෂයාට භාරයි, කැපයි.. තුන් දවසෙන් තුන් වරුවෙන්, පස් දවසෙන්, පස් වරුවෙන්, හත් දවසෙන් හත් වරුවෙන්, මේ පස් වගේ විනාශ වන්නා සේම ම මගේ ඇගේ ලේ හෙලෙව්ව මේ නම් කිවුව හතුරෝ හැතිරියන්ගේ ඇට නහර කුඩු කරවා, පිස්සු වට්ටලා, කටින් කියවලා දැඩි දඬුවම් ලබාදෙන සේක්වා''* (A1, සම්මුඛ සාකච්ඡා, 2022).

මේ ආකාරයෙන් කියවන යාච්ඤාව කපුමහතා කිව්වට පසුව ඒ අදාළ බාරය කරන පුද්ගලයා කියවයි. මේ කියවීම සිදු කරන්නේ මිරිස් ගල මත පස් වර්ගයකින් සැර ද්‍රව්‍ය රවුම් හැඩති ගලකින් කොටමින් ය. මේ ප්‍රකාශය කියවා අවසානයේ ඒ අඹරූ සියලු ම දේවල් ඒ රවුම් හැඩති ගලින් ඉදිරියට තල්ලුකර ඒ ගල ඔසවා නැවතත් ආපස්සට ගනු ලබයි. කිසිවිටකත් එම ගල තමා වෙතට ආපස්සට ඇඹරුම් ගල මතින් ගනු නොලබයි. මන්දයත් තමා විසින් සිදුකරන ලද ශාපය තමා වෙත ම ඒවි යයි යන විශ්වාසය නිසාවෙනි. එමනිසා බැතිමතුන් මෙම ක්‍රියාව කිරීමේදී හිතා සැලකිල්ලකින් සුපරික්ෂාකාරීව එය සිදු කරයි.

මේ ක්‍රියාවලියේ ඓතිහාසික පදනම ගත් කළ කුවේණිගේ පුත්‍රයාගේ පළිගැනීම ගත් විට එය දෙවොල් දෙවියෝ නමින් නිල වශයෙන් ශාප කිරීම සිදු කළ හැකි වුව ද සැබෑ කාර්යය සිදු කරනු ලබන්නේ දිවි යක්ෂයා විසිනි. දිවි යක්ෂයා පිළිබඳ දැක්වීමේ දී ඔහු සිත්ගන්නා චරිතයකි. ඔහු සීනිගම මිථ්‍යා විශ්වාසවලට අනුව සිංහල ජාතියේ නිර්මාතෘ ආර්ය විජය කුමරුගේ සහ කුවේණි නම් යක්ෂ බිසවගේ පුත්‍රයෙකි (Gunawardhana, 1985). යක්ඛ යනු ලංකාවේ ප්‍රධාන ප්‍රදේශවාසීන් වූ අතර ඔවුන්ට රාජධානි සහ නගර යන දෙකම තිබුණි . ආර්ය ජයග්‍රාහකයන් විසින් ඔවුන් යටත් කර පසුව යක්ෂාවේශ කරන ලදී (Feddema, 1997). යක්ෂයන් හෝ නපුරු ආත්මයන් අද හඳුන්වනු ලැබේ. දිවි යනු දඩබ්බරයෙකි, මන්ද සිංහල ජාතියේ නිර්මාතෘ කුවේණි මවගේ පැත්ත ගත් විට ඔහුව මරා දමන ලදී. යක්ෂයා විනාශ කර යටත් කර ගැනීම සඳහා ඇය සහ ඇගේ ආදරය ප්‍රයෝජනයට ගත් පසු ජයග්‍රහණ ඔහු විසින් අයුතු ලෙස සලකමින් එළවා දමන ලදී. දෙවොල් ත්‍රිවන්ද්‍රම් (දකුණු ඉන්දියාව) සිට ලංකාවට පැමිණි විට, දීවි ඔහුට තවත් යක්කු කණ්ඩායම් එකොළොහක් සමඟ සීනිගමට ගොඩ බැස පත්තිනි දෙවොල් ඉදිරිපිට තිබූ ගිනි කඳු ආරක්ෂිතව තරණය කිරීමට උදව් විය. එය සංකේතවත් කිරීමට දෙවොල් මඩු මංගල්‍යයක් තුළ දෙවොල් ගොඩබෑමේ දී ඔවුන්ගේ උපකාරයට ස්තුති කිරීම සඳහා දීවි සහ අනෙක් (එකොළොස්) යකුන් සඳහා තෙල් පහන් 12 ක් දල්වයි.

නීතියෙන් වෙනුවට කරන නවීන ක්‍රමයට විකල්පයක් ලෙස ශාප කිරීම සැලකේ. මෙම තාර්කිකත්වය උපයෝගී කරගනිමින් යහපත් ක්‍රියාවන් පවා ශාප කිරීමේ පුරුද්දට හවුල් වේ. ඒ අනුව බැතිමතුන්ගෙන් බොහෝ පිරිසක් ඔවුනට සිදුවූ අසාධාරණයන්ට එරෙහිව නීතියෙන් සහනයක් නොමැති වූ විට දෙවියන්ගෙන් සහන පතා එන අවස්ථා වැඩි වශයෙන් දැක ගන්නට හැකි විය. එය පහත ප්‍රකාශයගෙන් තවදුරටත් තහවුරු වේ.

*''ගෙදර කවුරුවත් නැති වෙලාවෙ මගේ පියාගේ බෙල්ලට පිහි පාරවල් හයක් ඇදලා තියෙනවා. දෙවියන්ගෙන් යාච්ඤා කරලා ඉල්ලනවා තාත්තගේ ලේ හැලුවා හා සමානව උන්ගෙත් ලේ හැලිලා අපට ඒක පෙන්නුම් කරන්න කියලා''* (සම්මුඛ සාකච්ඡාමය දත්ත, 2022).

''ගේ ගාව හතුරෙක් කඩුවකින් ගහලා, මට සාධාරණයක් වුණේ නෑ පොලීසියෙන්. ඒ බැරිවුණ සාධාරණේ ඉෂ්ට කරගන්න තමයි මං අද දෙයිහාමුදුරුවෝ ළඟට ආවේ'' (සම්මුඛ සාකච්ඡා, 2022).

මෙම ආගමික දඬුවම් ක්‍රමයේ සෘණාත්මක පැති වන්නේ ස්වාධීන විනිසුරුවරයෙකු හෝ ප්‍රමාණවත් අධිකරණ පද්ධතියක් නොමැතිකම සහ සැකකරුවන් සැමවිට ම වැරදිකරුවන් ලෙස පෙනී සිටීමයි (Feddema, 1995). යමෙක් නීතිය තම අතට ගන්නා අතර එසේ කළ හැක්කේ යම් මුදලක් වෙනුවට ඔහුට හෝ ඇයට උපකාර කිරීමට දෙවියෙකු හෝ පූජකයෙකු සූදානම් වන බැවිනි. Girad (1984) නියමයන් අනුව සැකකරු සමහර විට විවිධ කලකිරීම් සඳහා ගොදුර බවට පත්විය හැකි ය. එමෙන් ම දෙවියන්ගේ උපකාරයෙන් විවෘත හා සාධාරණ නඩු විභාගයකින් තොරව බිල්ල නෙරපා හරිනු ලැබේ.

ෆ්‍රොයිඩ්ට අනුව එක්තරා ලෙසකට මිනිසුන් සතුටින් තබා ගැනීමට ආගම ඉතා වැදගත් වෙයි. එහිදී සමාජමය වශයෙන් පුද්ගලයාගේ පීඩනය අවම කිරීමට ආගමික විශ්වාස මත පදනම් වූ  යාතුකර්ම බොහෝ සෙයින් වැදගත් වේ. ඒ අනුව පුද්ගලයන්ගේ ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් මැඩපැවැත්වීම සඳහා ද ආගමික කාර්යයන් මැනවින් ප්‍රයෝජනවත් වෙයි. ෆ්‍රොයිඩ් දක්වන ආකාරයට ආගම මනෝභාවීමය සහනයක් ලෙස පෙන්වා දෙයි. එහිදී අවසානයේ තමන් විසින් ම තමන්ගේ මනෝභාවයන් පාලනය කර ගැනීමක් සිදු කරයි. ඔහුට අනුව ආගමේ මනෝභාවීමය කාර්යභාරය ඉතා වැදගත් වේ. එය විශාල වශයෙන් මානසිකමය භූමිකාවක් ඉටුකරයි. මෙහිදී විශේෂයෙන් ම,

- පුද්ගලයන්ගේ අවිඥානයේ තිබෙන ප්‍රචණ්ඩකාරී මානසික තත්වයන් සමනය වීමක් සිදුවේ.
- එහිදී සමාජයේ පුද්ගලයන්ට භෞතිකව හානියක් වීම වළක්වයි.
- සමාජයට ඒ හරහා කෘත්‍යයක් සිදුවෙයි.
- එය ඇත්ත වශයෙන් ම ආගමික සංස්කෘතියේ තාර්කික පදනම ලෙස පෙන්වා දිය හැකිය.

එහිදී ඇත්ත වශයෙන් ම පුද්ගල හැඟීම් අවරෝධනය කරගන්නවා වෙනුවට එම හැඟීම් ප්‍රචණ්ඩකාරී වුව ද ඒවා කිසිදු කිසිදු කෙනකුට හානියක් නොවන පරිදි ආගමික යාතුකර්ම ඔස්සේ මුදාහැරීම පුද්ගල මානසික සෞඛ්‍යයට පවා හිතකර තත්ත්වයක් ලෙස ෆ්‍රොයිඩ්ගේ මතය අනුව පෙන්වා දිය හැකි ය.

සිග්මන් ෆ්‍රොයිඩ්ගේ විග්‍රහයට අනුව, ‘‘ආගම මනසේ නිෂ්පාදනයක් වේ’’. ඒ අනුව මිනිස් මනසේ ගැඹුරෙහි පවතින අවශ්‍යතා ප්‍රකාශයට පත් කරන මාධ්‍යයක් ලෙස ආගම හැඳින්විය හැකිය. මිනිස් අවශ්‍යතා සන්තර්පණය නොවන අවකාශයකදී ඇතිවන පීඩනය සන්තර්පණයට මිනිසා අවිඥානිකව ආගම වෙත යොමුවේ. ඉහත පුද්ගලයින්ගේ අරමුණු ඒ අනුව මෙකී තත්ත්වයන් සමඟද බැඳී පවතී.

Obeysekere විසින් ෆ්‍රොයිඩ්ගේ මනෝ විශ්ලේෂණවාදය ඇසුරින් ශ්‍රී ලංකා සමාජය තේරුම් ගැනීමට උත්සාහ ගනී. මිනිසුන් තුළ තිබෙන ගැටලු, මානසික පීඩන තත්ත්වයන්ට ආගම තුළින් ආධ්‍යාත්මක සහනයක් ලබාගැනීමට උත්සාහ කරන බව ඔහු දක්වයි. ඒ අනුව ආගමික වශයෙන් වන්දනාමාන කිරීම හරහා ඔවුන් උත්සාහ කරනුයේ එකී තත්ත්වයන්ට එනම්, සමාජ රෝග ලක්ෂණ හෙවත් අපේක්ෂා භංගත්ව සඳහා යම් සහනයක් ලබාගැනිමට ය. විශේෂයෙන් ම ආරක්ෂාව, බලාපොරොත්තු සහ විසඳුම් අනපේක්ෂිත තත්ත්වයන්හීදී ආගම මඟින් පුද්ගලයාව අනෝමීයත්වයට පත්වීම වළක්වාලන බවත්, මානසික වශයෙන් එම තත්ත්ව සමනය කිරීමක් සිදු වන බවත් යටකී දත්ත ඔස්සේ පැහැදිලි වේ.

නමුත් කාල් මාක්ස් පෙන්වා දෙන පරිදි ආගම තුළින් මිනිසුන්ට තාවකාලික මායාකාරී වින්දනයක් (Illusory Happiness) සංතෘෂ්ටියක් ලබාදෙයි එතුලින් සදාතනික සන්තෝෂයක් හා සැපයක් ලබා නොදෙන බව පෙන්වා දෙයි.

## 3.3 දේශපාලන චර්යාව සහ සීනිගම දේවාලයේ යාතුකර්ම

දේශපාලන සංස්කෘතිය ආනුභවික විශ්වාසයන් ප්‍රකාශන සංකේත සහ සමාජයක සිදුවන ඇතැම් දේශපාලන ක්‍රියා නිර්වචනය කරන වටිනාකම් වැනි බොහෝ ලක්ෂණවලින් සමන්විත වූ අංශයකි (Verba, 2015). නමුත් නූතන ශ්‍රී ලංකාවේ දේශපාලන සංස්කෘතිය ගත්කල එහි දී විශේෂයෙන් ම බහුලව වතින මිත්‍යා විශ්වාස සහ පිළිවෙත් ශ්‍රී ලංකාවේ දේශපාලඥයන් තම දේශපාලන ජීවිතය ඉදිරියට ගෙන යාමට ජෝතිෂ මත යැපීම හඳුනාගත හැකි බව Thalpawila (2021) පෙන්වා දෙයි. එහිදී තැමුන් ජයග්‍රහණයක් ලබාගැනීමට හෝ යම් ඉලක්කයක් සපුරා ගැනීමට පොල් ගසති.  එමෙන් ම තමන් අකමැති පුද්ගලයින්ගෙන් පලි ගැනීම සඳහා මෙන්ම ඔවුන්ගේ සියලු සැලසුම් කඩාකප්පල් කරනු ඇතැයි විශ්වාසයෙන් ඇතැමුන් මෙවන් ක්‍රියාවල යෙදෙයි. ඒ අනුව මෙම සීනිගම දේවාලයේ පවතින මෙවැනි යාතුකර්ම සඳහා පැමිණෙන බැතිමතුන් අතර ශ්‍රී ලංකාවේ දේශපාලනඥයන්ගේ සක්‍රීය සම්බන්ධවීම ප්‍රධාන වශයෙන් හඳුනා ගන්නා ලද්දකි. එනම් තමන්ගේ දේශපාලන අභිලාෂයන් මුදුන් පමුණුවා ගැනීම, ඇතැම් දේශපාලන ක්‍රියාදාමයන්ට එරෙහිව යාතුකර්ම මගින් දඬුවම් පැමිණවීම වැනි අරමුණු උදෙසා ඔවුන් මෙහි පැමිණීම සිදුවේ. විශේෂයෙන්ම ඡන්ද සමයන්හිදී තමා ජයග්‍රහණය කිරීමේ අපේක්ෂාවෙන් භාරහාර වීමට මෙන් ම විරුද්ධ දේශපාලන කණ්ඩායම් හෝ පුද්ගලයන් සඳහා පලි ගැසීමට දේශපාලකයෝ සිනිගම දේවාලය වෙත පැමිණීම හඳුනාගත හැකි ය. එය කපු මහතුන්ගේ පහත ප්‍රකාශ මගින් තවදුරටත් සනාථ වේ.

*''ඇත්තට ම ඡන්දෙ කාලේ ළං වුණා ම පක්ෂ පාට භේදයක් නැතුව එක එක මැති ඇමතිවරු දෙවොල් දෙයිහාමුදුරුවන්ට බාර හාර වෙන්ට එනවා. පළතුරු වට්ටි පූජා වට්ටි අරගෙන. එතකොට සමහරවිට දේවාලයටත් සමහර අය උදව් උපකාරත් කරනවා''* (සම්මුඛ සාකච්ඡාමය දත්ත, 2022).


*'' මෑත කාලෙදි මේ ගැන කතා කළොත් එහෙම ගොඩක් දේශපාලකයෝ තමන්ගේ විරුද්ධවාදීන්ට පලි දරන්න මිරිස් අඹරන්ඩ මෙහෙට ආවා.  ඒගොල්ලො විශේෂ වෙලාවක් වෙන්කරගෙන මුහුද දේවාලයට ගිහිල්ලා මිරිස් සමරන කටයුත්ත සිද්ධ කරා. මං හිතන්නේ ඒවා ටීවී එකේ පෙන්නන්න ඇති ''* (සම්මුඛ සාකච්ඡාමය දත්ත, 2022).

මේ ආකාරයෙන් ගත්විට සීනිගම දේවාලය දේශපාලකයින් අතර ඉතා සුප්‍රසිද්ධ සිද්ධස්ථානයක් ලෙස පෙන්වා දිය හැකිය. තව ද එවැනි ක්‍රියාකාරකම් තව තවත් ප්‍රචාරණය උදෙසා මාධ්‍ය ද යම්කිසි කාර්යයක් ඉටු කරමින් පවතින බව පෙන්වා දීම සාවද්‍ය නොවේ.  නමුත් ඒ තුළ පවතින්නා වූ  ප්‍රායෝගිකභාවය සහ යථාර්ථවාදී දැක්ම තේරුම් නොගෙන වැනි ප්‍රචාරණයක් ලබා දීම කොතෙක් දුරට සාධාරණ ද යන්න ගැටලුසහගත ය. එමෙන් ම ඇතැම් විට  දේශපාලනය වැනි ප්‍රායෝගික ක්‍රියාදාමයන් මිථ්‍යාමය  යාතුකර්ම තුළ ස්ථානගත කරන  ප්‍රධාන  සංකේතයක් ලෙස  සිනිගම දේවාලය පෙන්වා දිය හැකිය. මන්දයත් දේශපාලන අරමුණු උදෙසා දේව ඇදහිලි විශ්වාස හා සම්බන්ධ පූජාකර්ම රාශියක් ද සීනිගම දේවාලය තුළ සිදුවන බැවිනි. ඇතැම්විට මෙම ක්‍රියාදාමයන් ඔස්සේ මෙම පූජනීය ස්ථාන දේශපාලනකරණයට නතුවීම හෝ දැනටමත් මතුවී තිබීම  මේවායේ  ප්‍රතිඵලයක් ලෙස ද පෙන්වා දීම සාධාරණ වේ.

## 3.4 බෞද්ධ දර්ශනය හා සම්බන්ධව සීනිගම දේවාලය පිළිබඳව තිබෙන පරස්පර විරෝධතා

සිංහල බෞද්ධ ආගමික ධූරාවලිගත ව්‍යුහයට දෙවියන් අනුකලනය වී තිබේ. ඒ අනුව ගත් කල දෙවොල් දෙවියන් සහ යක්ෂයන් සඳහා පුද පූජා බාර හාර සිදු කරන, ශාප කිරීම් සිදු කරන මෙම සීනිගම දේවාල භූමිය තුළ බුද්ධ වන්දනාවට අදාළව පවතින සියලු දෑ සලසා තිබීම දැකගත හැකි ය (බෝධිය, විහාරගෙය). අද වන විට එහි ධාතු මන්දිරයක් ද ඉදි කරවා විවෘත කොට ඇත. මේ සම්බන්ධයෙන් විවිධ පරස්පර විරෝධතා

මතු වී ඇත. බෞද්ධ ආගමික ධූරාවලිගත ව්‍යුහයට (Buddhist Pantheon) අනුව විමසීමේ දී එය කොතෙක් දුරට තාත්වික ද යන්න ගැටලු සහගත ය. බෞද්ධ ආගමික ධූරාවලිගත ව්‍යුහය (Buddhist Pantheon) පහත දැක්වේ. ඒ හරහා භාවිතාත්මක බුදුදහම කාලානුරූපීව වෙනස් වූ ආකාරය දැක්වේ **(රූපසටහන 03)**. මෙම දේව ධූරාවලිගත වීම සමාජය සමඟ සම්බන්ධ වන බව කිව යුතුම ය




**රූපසටහන 03: බෞද්ධ දේව ධූරාවලිය** මූලාශ්‍ර: Winslow (1984)

දෙවි දෙවතාවුන්ගේ ජනප්‍රියභාවය වෙනස්වන සමාජ, ආර්ථික, දේශපාලන සාධක මත තේරුම්ගත යුතුය (Obeyesekere, 1962). මෙහි දී බුදුන් වහන්සේ ධූරාවලියේ ඉහළ ම සිටින අතර ශුද්ධත්වය අනුව, බෞද්ධ මතයට අනුව හින්සාකාරී දෙවිවරුන් සහ යකුන් බුදුන් වහන්සේ ආසන්නයේ තබා නැත. ඒ පෙර දැක්වූ සමාජ, ආර්ථික, දේශපාලන සහ සංස්කෘතිකමය කරුණු අනුව ය.

ඒ අනුව ගත් කල සීනිගම දේවාලය වෙත යන්න බැතිමත් ප්‍රජාව අතර බොහෝ සෙයින් සිටිනුයේ බෞද්ධ ප්‍රජාවයි. එහිදී ඔවුන් දෙවොල් දෙවියන්ට බාරහාර වනවා පමණක් නොව පෙර දැක් වූ පරිදි ශාප කිරීම වැනි ක්‍රියාවන් ද සිදුකරයි. බුදු දහම අවිහිංසාවාදී මෙන් ම පාපයෙන් තොර දර්ශනයක් ලෙස පැවතිය ද මෙවන් ක්‍රියාකාරකම් තුළින් ඒ කොතෙක් දුරට බැතිමත් ප්‍රජාව අතින් ඉටු වනවා ද යන්න ගැටළු සහගත ය. Gombrich (1971) පෙන්වා දෙන පරිදි සියලුම චාරිත්‍ර වාරිත්‍ර සහ විශ්වාසයන් බෞද්ධ විශ්ව විද්‍යාවකට ඒකාබද්ධ කොට ඇත.

දෙවියන් ගත්කල ඔහු යක්ෂ සේනාවක් පිරිවරාගත් දෙවියන් අතර දෙවොල් දෙවියන් විසින් බැතිමතුන්ට පිහිට සේම ශාප පැමිණවීමද සිදු කරන බව ජන විශ්වාසයයි. සාමාන්‍යයෙන් සිංහල බෞද්ධ දෙවිවරු මිනිසුන්ගේ යහ පැවැත්ම ආරක්ෂා කරන අතර කළු අභිචාර සහ මිනිසුන්ට හානි කිරීම රිදවීම හෝ මරා දැමීම වැනි ක්‍රියාවන්ගෙන් වැළකී සිටින බවට විශ්වාස කරයි. එමෙන් ම Gombrich සහ Obeysekere (1988) පෙන්වා දෙන පරිදි බුදුන් ප්‍රියකරන දෙවියෙක් ඉතා ශුද්ධ ව පෙනිය යුතුය. අනෙක් අතට ගත් විට සමාජය තුළ බුදු දහමේ සදාචාරාත්මක බලපෑම ද පවතී. එහිදී මේ සම්බන්ධයෙන් අදුරු පැති වලින් තොරව දෙවිවරුන්ට මනාපය ලබා දීම සිදු කළ යුතු විය. මෙයින් පෙනෙනුයේ සමාජය තුළ යම් පරස්පර විරෝධී දෙයක් පවතින බවයි.

මන්දයත් ශාප කිරීම තුළින් ජීවිතවලට හානිය පතා එය සිදු කිරීම හේතුවෙන් තුළ යම් පාප ක්‍රියාවක් සිදුවන බැවිනි. මේ කෙසේ නමුත් නූතනය වන විට බෞද්ධයන් විශාල පිරිසක් මෙවැනි ශාප කිරීම් හා සම්බන්ධ දේවාලවලට එක්රැස්ව තම විරුද්ධවාදීන්ට පලි ගැසීම එරෙහි වීම් සිදුකරනු ලබයි.

මේ හේතු නිසාවෙන් මෑත කාලයේ සීනිගම දේවාලය ඉදිකරන ලද සර්වඥ ධාතූන් වහන්සේලා තැන්පත් කරන ලද ධාතු මන්දිරයක් ඉදිකිරීම උචිත නොවන බවට විවාදාත්මක කතිකාවක් ගොඩනැගී ඇත. 2019 වර්ෂයේ දී ඉදිකරන ලද මෙම ධාතු මන්දිරය එවකට සිටි ජනාධිපතිවරයා විසින් විවෘත කළ පසු එයට විරෝධතාවක් භික්ෂූන් වහන්සේලා ඇතුළු බොහෝ පිරිසකගෙන් එල්ල වී ඇත (ලියනගේ, 2019). ඒ අනුව එක් පාර්ශවයක අදහස වූයේ සීනිගම දේවාලය ඉතිහාසයේ සිට ම ජනතාව අතර ප්‍රසිද්ධ වී ඇත්තේ දුකට පත් ජනතාවගේ ප්‍රශ්නවලට පිහිට වන ස්ථානයක් ලෙසයි ලෙස බවත් එබැවින් එම ස්ථානයට බැතිමතුන් පැමිණෙනු ලැබුවේ තමන්ට කරදර කරන අයට එරෙහිව පොල් ගැසීමට, මිරිස් ඇඹරීමට ආදී කාර්යයන් ඉටුකර ගැනීම සඳහා ය. එවන් කාර්යයන් සිදු කෙරෙන මෙම දේවාල භූමිය තුළ මෛත්‍රිය කරුණාව වඩවන බුදුන් වහන්සේට වැඳුම් පිදුම් කිරීමට සුදුසු ස්ථානයක් නොවන බව ඔවුන්ගේ අදහස විය.

මේ අනුව ගත් කළ සීනිගම දේවාලයේ වැඳුම් පිදුම් සම්බන්ධයෙන් වන ක්‍රියාවලින් ඇතැම් අවස්ථාවක දී පරස්පර විරෝධතා මතු කරන සමාජය තුළ කතිකාවක් නිර්මාණය කරන සිද්ධස්ථානයක් ලෙස ද පෙන්වා දිය හැකි ය.

## 4. නිගමනය

සමාජ සංස්ථාවන්ගෙන් නිර්මිත ඒකකයක් ලෙස සමස්ත සමාජය හැඳින්විය හැකි ය. සමාජ විද්‍යාඥයින් අනෙකුත් සමාජ සංස්ථා මෙන් ම ආගමික සංස්ථාව ද අධ්‍යයනය කර ඇත. ආගම හා සමාජය අතර පවතින්නා වූ ද්වන්ධාත්මක සම්බන්ධතාවය හේතුවෙන් ආගම විසින් සමාජයට කුමන කාර්යයක් ඉටු කරන්නේ ද යන්න සමාජ විද්‍යාඥයින් විසින් අධ්‍යයනය කෙරේ.

මෙහිදී පැහැදිලි වූයේ, ආගමේ කාර්යයභාරය වන මිනිසුන්ට අනන්‍යතාවයක් ලබා දීම, ආගමික වස්තූන් පිළිබඳව ඔවුන් තුළ විශ්වාසය නිර්මාණය කිරීම, මිනිසුන්ව ආගමට බැඳ තබා ගැනීම, මිනිසුන්ගේ භෞතික ප්‍රචණ්ඩකාරී තත්ත්වයන් සමනය කිරීම, මිනිසුන්ගේ ආතතිය, අනතුරුදායක තත්ත්වය සමනය කිරීම යනාදිය මෙම ආගමික මධ්‍යස්ථානය මඟින් ඉටුවන බවයි. ආගමික මෙන් ම සමාජ හා සංස්කෘතික කාර්යයන් ද මෙම ආගමික මධ්‍යස්ථානය මඟින් ඉටු කරනු ලැබේ.

තව ද, මෙහි පැමිණෙන බැතිමතුන්ගේ අරමුණු ද, සමාජ අවශ්‍යතා අනුව නිර්මාණය වූ ආර්ථික, සමාජ, සංස්කෘතික සහ දේශපාලන මානයන් කරා විහිදී යන අතර, ආගමික සිද්ධස්ථානය ලෞකික හා ලෝකෝත්තර අංශයන් එකිනෙක බද්ධ වීමට බලපා තිබේ. එමෙන් ම සමාජයේ පවතින්නා වූ සමාජයීය විභේදන නොතකමින්, සියලු ම ආකාරයේ විෂමතා සහිත පුද්ගලයින්ට මෙහි පැමිණීමට හැකිවීම විශේෂත්වයකි.

මේ අනුව පැහැදිලි වන්නේ, ශුද්ධ වස්තුවක් වටා මිනිසුන් විසින් ගොඩනගා ගත් මෙම මධ්‍යස්ථානය මිනිසා විසින් ම පාලනය කර පවත්වාගෙන යමින්, වන්දනා කරමින්, මිනිසාගේ භෞතික මෙන් ම මානසික අභිවෘද්ධිය උදෙසා ම ක්‍රියා කරන බවයි. ඒ අනුව විවිධ පරස්පර විරෝධතා ගොඩනැගී තිබුණ ද ආගම සමාජයෙන් විතැන් කළ නොහැකි අත්‍යවශ්‍ය සංස්ථාවක් බවට මෙකී ආගමික සිද්ධස්ථානය හා සම්බන්ධ තත්ත්ව සාක්ෂි දරනු ඇත.

## 5. ආශ්‍රිත ග්‍රන්ථ

කුමාර, එන්. වී. ජී. ඒ. එච්. (2002). *සමාජ විද්‍යාවේ මූලික සංකල්ප, න්‍යාය හා ක්‍රමවේද.* මුල්ලේරියාව: විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

ජයසිංහ, ඒ. කේ. ජී. (2013). *සමාජ විද්‍යාව - මූලික සංකල්ප 2.* කඩවත: නුවණි ප්‍රකාශන.

ධර්මදාස, කේ. එන්. ඕ., සහ තුන්දෙනිය, එච්. එම්. එස්. (1994). *සිංහල දේව පුරාණය.* රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

පලිහපිටිය, ආර්. ඒ. (2007). *සෙත සලසන සීනිගම දෙවොල් දෙවියෝ.* ඉන්ද්‍රා මුද්‍රණාලය.

මාලිමගේ, ඒ. (2007). *සිද්ද දෙවොල් දෙවියෝ.* කර්තෘ ප්‍රකාශන.

ලියනගේ, ජේ. (2019 ජූනි, 8). සීනිගම පොල් ගහන, මිරිස් අඹරා සාප කරන තැන ධාතු මන්දිරයක් හදති, දැඩි විරෝධය. *Lanka C News*. https://lankacnews.com

සමරවීර, ජී. (2021 ජූනි 26). සීනිගම දෙවොල් දෙවි මහා සාමි විදේශිකයෙක් ද?. *Roar Media*. https://roar.media/sinhala/main/history/god-devol-seenigama/amp

Allen, D. (1972). *Mircea Eliade's Phenomenological Analysis of Religious Experience. The Journal of Religion*. Chicago: University of Chicago Press. Available on: https://www.jstore.org/stable/1201637

Bell, C. (1997). *Ritual: Perspectives and Dimentions*. Oxford University Press.

Eley, N. T., Namey, E., McKenna, K.Johnson, A. C. & Guest, G. (2019). Beyond the Individual: Social and Cultural Influences on the Health-Seeking Behaviors of African American Men, *American Journal of Men's Health,* 13(1), pp: 1–11

Feddema, J. P. (1997). The Cursing Practice in Sri Lanka as a Religious Channel for Keeping Physical Violence in Control: The Case of Seenigama. *Journal of Asian and African Studies*, 32 (3-4), pp. 202- 222.

Grau, A. (2001). Ritual Dance and "Modernaisation": The Tiwi Example. *International Council for Traditional Music,* 33, pp 73-81.

Gunawardena, R. A. L. H. (1985). The People of the Lion: Sinhala Consciousness in History and Historiography. *In: Ethnicity and Social Change in Sri Lanka*, 55-107.

Lukes, S. (1917). *Emil Durkheim: His Life and Work: a Historical and Critical Study.* Stanford University Press.

Obeyesekere, G. (1962). The Sinhalese Buddhist Pantheon and Its Extensions. In Nash, M. (ed.) *Proceedings of the Conference Theravada Buddhism*. New Haven: Yale University.

Obeyesekere, G. & Gombrich, R. (1988). *Buddhism Transformed: Religious Change in Sri Lanka*. New Jersy: Princeton University Press.

Obeyesekere, G. (1975). Sorcery, Premeditated Murder, and the Canalization of Aggression in Sri Lanka. *In: Ethnology*, 14(1), pp. 1-23.

Thalpawila, O. N. (2021). Superstitious Beliefs and Practices in Politics: An Aspect of Political Culture in Sri Lanka. *International Journal of Arts, Humanities and Social Studies*, 3(5), pp 51-57.

Udayanga, S. (2021). Cultural understanding of 'spiritual well-being' and 'psychological well-being' among Sinhalese Buddhists in Sri Lanka. *Sri Lanka Journal of Social Sciences 2021*, 44 (1), pp 33-53. DOI: https://dx.doi.org/10.4038/sljss.v44i1.7990

Verba, S. (2015). *Small groups and political behaviour.* Princeton University Press.
Winslow, D. (1984). A Political Geography of Deities: Space and the Pantheon in Sinhalese Buddhism. *The Journal of Asian Studies*, Vol. 43.